ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

இலங்கை கைப்பணிப் பொருட்கள் சபை

Sri Lanka Handicrafts Board













වාර්ෂික වාර්තාව

ஆண்டு அறிக்கை

Annual Report

2022





LAKSALA

STATE GIFT & SOUVENIR BOUTIQUE

වාර්ෂික වාර්තාව 2022

ලක්සල

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

පටුන

ආයතනික තොරතුරු	**01**
ලක්සල ප්‍රදර්ශනාගාර ජාලය	**02**
දැක්ම සහ මෙහෙවර	**03**
කාර්යය සමාලෝචනය සහ මෙහෙයුම් සමාලෝචනය	**04 - 10**
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්	**11**
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම	**12**

මූල්‍ය වාර්තා

වර්ෂය පිළිබඳ සංක්ෂිප්තය	**15**
විස්තීරණ ආදායම් ප්‍රකාශය	**16**
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	**17**
කොටස් හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය	**18**
මුල්‍ය ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	**19**
මුල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	**20 - 38**
විගණකාධිපති වාර්තාව	**39 - 50**

ආයතනික තොරතුරු

ආයතනයේ නම

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය- ලක්සල

ව්‍යවස්ථාපිත ස්වභාවය

1982 අංක **35** දරණ ජාතික ශිල්ප සභා සහ අනුබද්ධිත ආයතන පනත යටතේ

ප්‍රධාන කාර්යාලය

අංක : 215, බෞද්ධාලෝක මාවත, කොළඹ 7

දුරකථන : 011 2557132 / 011 2055501

ෆැක්ස් : 011 2594872

අලෙවි විමසීම්

ඊ-මේල් : info@laksala.gov.lk

වෙබ් අඩවිය : *www.laksala.gov.lk*

අලෙවි තොරතුරු

දුරකථන : 011 25**97797**
ඊ-මේල් : info@laksala.gov.lk

විගණනය

විගණකාධිපති දෙපාර්තමේන්තුව

බැංකු

ලංකා බැංකුව

මහජන බැංකුව

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

ලක්සල ප්‍රදර්ශනාගාර ජාලය

1. කොටුව	අංක. **60,** යෝර්ක් වීදිය, කොළඹ **01**.	**011-2323514**
2. තුම්මුල්ල	අංක.**215,** බෞද්ධාලෝක මාවත,තුම්මුල්ල, කොළඹ **07.**	0**11-2580579**
3. නුවර	අංක.**05,** සංඝරාජ මාවත, නුවර.	**081-2222087**
4. කටුබැද්ද	අංක.**282,** ගාලු පාර, කටුබැද්ද මොරටුව.	**011-2605600**
5. ජාතික කෞතුකාගාරය	ලක්සල, කෞතුකාගාර පරිශ්‍රය, කොළඹ **07.**	**011-2698263**
6. බත්තරමුල්ල	අපේ ගම, පැලවත්ත, බත්තරමුල්ල.	**011-2786026**
7. වැලිපැන්න	දක්ෂිණ අධිවේගී මාර්ගය,විරාම මන්දිරය සේවා පෙදෙස ‘‘බී’’, ඒ**5** සහ ඒ**6**, වලගෙදර වැලිපැන්න.	**034-2241607/8**
8. ගාල්ල	අංක.**74/1,** සමුද්‍ර මාවත, ගාල්ල.	**091-2222783**
9. පින්නවල	අලි අනාථාගාරය, පින්නවල.	**035-2265015**
10. පේරාදෙණිය	අංක.**14,** උද්භිද උද්‍යානය, පේරාදෙණිය.	**081-2389253/63**
11. කටුනායක	**54** ඩී, සංක්‍රමණික වෙන්ව යාමේ කලාපය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල, කටුනායක.	**011-2260167**
12. නුවරඑළිය	අංක. 79 පරණ උඩුපුස්සැල්ලාව පාර, නුවරඑළිය.	052-2234445

අපේ දැක්ම

ශ්‍රී ලංකාවේ ත්‍යාග සහ සමරු භාණ්ඩ වෙළඳපල ප්‍රමුඛයා බවට පත්වීම.

අපේ මෙහෙවර

ත්‍යාග සහ සමරු භාණ්ඩ ක්ෂේත්‍රය තුළ වර්ධනීය අවස්ථා පුළුල් කරමින් සහ සංචාරක කර්මාන්තයට උසස් වටිනාකම් එකතු කළ දායකත්වයක් සපයමින් ග්‍රාමීය නිපැයුම්කරුවන් හට පුළුල් වෙළඳපල අවස්ථා විවර කරමින් සමාජ වගකීම ඉටුකරන වාණිජ වශයෙන් සඵලදායී ආයතනයක් බවට පත්වීම

.

අපේ කේන්ද්‍රීය වටිනාකම්

- තත්ත්වය, විශ්වාසනීයත්වය සහ මුදලට වටිනාකම.
- විවිධ වූ මානයන්ගෙන් යුක්තව හොඳම පාරිභෝගික තේරීම උදෙසා අවස්ථා සම්පාදනය.
- ග්‍රාමීය ප්‍රජාව අතර වටිනාකම් නිර්මාණය සහ වටිනාකම් හුවමාරුව.
- පාරිභෝගිකයා උපරිම ලෙස තෘප්තිමත් කිරීම.

තිරසර සංවර්ධන ඉලක්ක


- **2030** වසර වනවිට දේශීය සැපයුම්කරුවන්ගෙන් මිලට ගනු ලබන නිපැයුම් ප්‍රමාණය දෙගුණ කරමින් දේශීය නිර්මාණ ප්‍රවර්ධනය.
- **2030** වසර වනවිට ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ළඟා කරගැනීමේ අරමුණින් ලක්සල වෙත භාණ්ඩ සපයන කාන්තා සැපයුම්කරුවන්ගේ මුළු සංඛ්‍යාව **50%** කින් වර්ධනය කිරීම.
- විශේෂ අවශ්‍යතා ඇති ප්‍රජාව දිරිගැන්වීම පිණිස **2030** වසර වනවිට විශේෂ අවශ්‍යතා ඇති සැපයුම්කරුවන්ගේ සංඛ්‍යාව **25%** කින් වර්ධනය කිරීම.




දේශීය අත්කම් නිපැයුම්කරුවන් හට දේශීය මෙන්ම විදේශීය වෙළඳපල අවස්ථා විවර කිරීමේ අරමුණින් **1964** වසරේදී ලක්සල ආයතනය ස්ථාපිත කරන ලද අතර **1982** අංක **35** දරණ ජාතික ශිල්ප සභා සහ අනුබද්ධ ආයතන පනත යටතේ ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය වශයෙන් එය සංස්ථාපිත කරන ලදී. මෙකී ක්ෂේත්‍රය තුළ මේ වන විට ලක්සල රජය සතු පැරණිතම සහ විශාලතම ජාලය බවට පත්ව තිබේ.

මූල්‍ය කාර්ය සාධන සාරාංශය

2022 සමාලෝචන වර්ෂය තුළ ලක්සල මුළු පිරිවැටුම රුපියල් 283,623,048.00 ක් වාර්තා කර ඇති අතර එහි විකුණුම් පිරිවැය රුපියල් 113,608,044.00 කි. පහත ප්‍රස්ථාරයෙන් දැක්වෙන්නේ පසුගිය වසර පහ තුළ ලක්සල සමස්ත විකුණුම්වල සාරාංශයයි.




2022 වර්ෂය තුළ විකුණුම් විශ්ලේෂණයේදී තුම්මුල්ල ලක්සල ප්‍රදර්ශනාගාරය රුපියල් 123,515,057.00 ක් වූ අලෙවියක් සිදු කර විකුණුම් සඳහා ප්‍රධාන දායකත්වය ලබා දී ඇති අතර පිලිවෙලින් විකුණුම් පිරිවැටුම රුපියල් 32,888,767.00 ක් හා රුපියල් 22,808,891.00 ක් වාර්තා කරමින් කටුනායක ලක්සල ප්‍රදර්ශනාගාරය හා ගාල්ල ලක්සල ප්‍රදර්ශනාගාරය 2022 වසරේ විකුණුම් ආදායම ඉහළ දායකත්වයක් ලබා දී ඇත.




මිලදී ගැනීම් විශ්ලේෂණය

2022 වර්ෂය තුළ ලක්සල විසින් රුපියල් 67,451,636.25 ක වටිනාකමකට වෙළඳ මිලදී ගැනීම් සිදු කර ඇත. පහත ප්‍රස්ථාරයෙන් පෙන්නුම් කරන්නේ පසුගිය වසර පහ තුළ වෙළඳ මිලදී ගැනීමේ ප්‍රවණතාවයයි.




පහත ප්‍රස්ථාරයෙන් අයිතම වර්ගීකරණයට අනුව 2022 වර්ෂයට අදාළ මිලදී ගැනීම් තවදුරටත් නිරූපණය කෙරේ. 2022 වෙළඳ මිලදී ගැනීම් විශ්ලේෂණය කිරීමේදී, වෙළඳ මිලදී ගැනීම්වලින් ඉහළ ප්‍රතිශතයක් කලා සහ අත්කම් අංශයෙන් නියෝජනය වේ.




වියදම් විශ්ලේෂණය

වියදම්	Y2021	Y2022
පරිපාලන වියදම්	187,070,962	218,216,410
බෙදා හැරීම් වියදම්	8,239,659	19,533,586
මූල්‍ය පිරිවැය	42,050,371	67,879,043
	237,360,992	***305,629,039***

පහත ප්‍රස්ථාර මගින් පෙර වසර හා සැසඳීමේ දී මුළු වියදම්වල සංයුතිය දක්වයි.





කාර්ය සාධන සමාලෝචනය - 2022 වර්ෂය

පසුබිම

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - ලක්සල 2022 වර්ෂයේ කාර්ය සාධන සමාලෝචනය සතුටින් ඉදිරිපත් කරමි. දේශීය හස්ත කර්මාන්ත නිර්මාණකරුවන් හට දෙස් විදෙස් වෙළඳපල අවස්ථා ඇති කරලීමේ අරමුණ පෙරදැරිව ලක්සල ආයතනය 1964 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර 1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභාව අනුබද්ධ ආයතන පනත යටතේ ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය වශයෙන් ස්ථාපිත කොට ඇත. ලක්සල මෙම ක්ෂේත්‍රයේ රජය සතු පැරණි සහ විශාලතම අලෙවි ජාලය බවට මේ වන විට පත්ව ඇත.

උපාය මාර්ගික ප්‍රවේශය,

ආරම්භ කරන ලද ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන් තුළින් තම පිරිවැටුම හා ලාභදායීත්වය මෙන්ම තිරසාර පැවැත්මක් සඳහා අත්‍යාවශ්‍ය, පාරිභෝගික ආකර්ෂණය වර්ධනය කරගත් අතර අවශ්‍යතාවයන්ට සහ ඉල්ලුමට සරිලන පරිදි අවශ්‍ය කටයුතු කිරීමට ගන්නා ලද ක්‍රියාමාර්ගයන් තවදුරටත් ශක්තිමත් කරන ලදී. එනම්,

- තම අලෙවිකරණ භාණ්ඩ කාණ්ඩ පුළුල් කරමින් නව වෙළඳපලක් ලබාගැනීම (Category Expansion).
- සන්නාමකරණය (Branding) තුළින් ආයතනයේ නාමය වෙළඳපළ තුළ ස්ථාපනය කිරීම.
- සංග්‍රහශීලී පාරිභෝගික සේවයකට අවශ්‍ය ආකාරයට සේවක මණ්ඩලය තුළ යහපත් ආකල්ප හා කුසලතා ගොඩනැංවීම.
- අන්තර්ජාලය හරහා ලක්සල භාණ්ඩ මිලදී ගැනීමේ පහසුකම් තව දුරටත් වර්ධනය කිරීම. (Online sales Facilities)
- ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය හා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය වැනි ආයතන හා පෞද්ගලික සංචාරක ආයතන සමඟ නිරතුරුව සම්බන්ධතා පවත්වා ගෙනයමින් ලක්සල ප්‍රදර්ශනාගාර සඳහා විදේශීය සංචාරකයින් ගෙන්වා ගැනීමේ කටයුතු සංවිධානය කිරීම.

ලක්සල වෙළඳනාමය යටතේ හඳුන්වා දෙන ලද ලක්සල ප්‍රදර්ශනාගාර තුල අලෙවි කරනු ලබන සියලුම භාණ්ඩ පෙළ තවදුරටත් පුළුල් කරන අතර ඒවා ගුණාත්මක හා උසස් තත්වයේ තෑගි හා සමරු භාණ්ඩ ලෙසින් දෙස් විදෙස් පාරිභෝගිකයන්ට පහසුවෙන් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු තවදුරටත් පුළුල් කරනු ඇත. ඒ අනුව ඉතා උසස් තත්වයේ නවීන විලාසිතා වලින් අනූන භාණ්ඩ රාශියක් අලෙවිය සඳහා ප්‍රදර්ශනය කරන අතර ලක්සල ශ්‍රී ලංකාවේ තෑගි හා සමරු භාණ්ඩ අලෙවිකරණයේ එකම රාජ්‍ය හා ප්‍රධාන වාණිජ ආයතනයක් බවට දෙස් විදෙස් පාරිභෝගිකයන්ගේ හදවත් තුළ රඳවා තබා ගැනීමට අවශ්‍ය අලෙවිකරණ කටයුතු පුළුල් කොට පාරිභෝගිකයින්, ආයතනය කරා තව තවත් ආකර්ෂණය කර ගැනීම හා රඳවා තබා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

සන්නාමකරණය තුලින් ආයතනයේ නාමය වෙළඳපල තුළ ස්ථාපනය කිරීම

ලක්සල තම අලෙවි ප්‍රදර්ශනාගාර වර්තමාන වෙළඳපොළට සරිලන ආකාරයෙන් ඉතා උසස් මට්ටමකට පත් කරන ලදී. ඒ අනුව ලක්සල ප්‍රදර්ශනාගාර නවීකරණය කර දෙස් විදෙස් පාරිභෝගික ආකර්ෂණය ඇතිවන පරිදි ඉතා ඉහළ මට්ටමකට පත් කිරීම මෙන්ම ලක්සල වෙළඳ නාමය යටතේ නිෂ්පාදන හඳුන්වා දෙමින් භාණ්ඩ ප්‍රදර්ශනය ඉහළ මට්ටමක පවත්වාගැනීම හා සන්නාමකරණය තුලින් අපේක්ෂිත අලෙවි ඉලක්ක සපුරා ගැනීමටද කටයුතු කරන ලදී.

සංග්‍රහශීලී පාරිභෝගික සේවාවකට අවශ්‍ය වන පරිදි සේවක මණ්ඩලය තුළ යහපත් ආකල්ප ගොඩනැංවීම.

පාරිභෝගික අවශ්‍යතා හඳුනා ගනිමින් ඔවුන් හට සංග්‍රහශීලි සේවයන් ලබා දීම සඳහා නව වෙළඳපොළට සරිලන ආකාරයට කටයුතු කළ හැකි සේවක මඩුල්ලක් පවත්වා ගැනීමට කටයුතු කිරීම සහ අවශ්‍ය නිසි පුහුණුව මෙන්ම පෙළඹවීම ඇති කිරීම තුළ ඔවුන්ගේ කාර්යක්ෂමතාවය ඉහළ මට්ටමක පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී. ඒ අනුව වැටුප් හා දීමනා ඔවුන්ගේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාව මත සිදුකිරීම තුලින් ඔවුන්ගේ උනන්දුව වර්ධනය කිරීම, තවදුරටත් ආයතනයේ මූලික අරමුණු ඉටුකර ගැනීමට බොහෝ දුරට උපකාරී වී ඇත.

නිෂ්පාදන අයිතමයන් පුළුල් කිරීම

නව උපාය මාර්ගික වැඩ පිළිවෙළ යටතේ ආයතනයේ කාර්යයන් පමණක් නොව තම වෙළඳ භාණ්ඩ කාණ්ඩයන්ද පුළුල් කිරීම සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානය, ජාතික ශිල්ප සභාව සහ අනෙකුත් අදාළ රාජ්‍ය ආයතන සමඟ එක්ව අවශ්‍යය පියවර ගන්නා ලදී. දේශීය නිෂ්පාදනවල අනන්‍යතාවය රැකගනිමින් වර්තමාන වෙළඳපළ අවශ්‍යතා සඳහා නව නිර්මණ ඉතා උසස් තත්වයෙන් යුතුව නිර්මාණය කොට වෙළඳපළට හඳුන්වා දීම හා මෙම තැගි සහ සමරු භාණ්ඩ කාණ්ඩයන්ට මැණික් සහ ස්වර්ණාභරණ, තේ, කුළු බඩු, සම් භාණ්ඩ, පිගන් භාණ්ඩ මෙන්ම දේශීය වෙස් මුහුණු සහ අනෙකුත් සමරු නිර්මාණ හඳුන්වා දුන් අතර ලක්සල නව නිර්මාණ අංශය විසින් ද නව අත්කම් නිපැයුම් හඳුන්වා දීම තුළින් තැගි හා සමරු භාණ්ඩ ක්ෂේත්‍රයේ නව නිර්මාණ රාශියක් එළි දැක්වීමට කටයුතු කරන ලදි.

සැපයුම් ජාලය

ලක්සල සැපයුම් ජාලය මගින් ප්‍රදර්ශනාගාරවල අලෙවි කිරීමට අවශ්‍ය තැගි හා සමරු භාණ්ඩ මිලදී ගැනීම මෙන්ම එම භාණ්ඩ නිෂ්පාදනය සැලසුම් කිරීම් තත්ව පාලනය හා නවීන මෝස්තර ලබා දීම ද ඇතුළත් වේ. **2021** වර්ෂයේ අවසන් වන විට ක්‍රියාකාරී සැපයුම්කරුවන් සංඛ්‍යාව 274 ක් පමණ වූ සමස්ත දේශීය හස්ත කර්මාන්ත ශිල්පීන් සංඛ්‍යාව මෙම වසර තුළ තවදුරටත් වර්ධනය වී ඇති අතර නව වෙළඳපළ අවස්ථා වැඩි දියුණු කිරීම තුළින් නව නිෂ්පාදකයින් හට මෙම ක්ෂේත්‍රය තුළට පිවිසීමට අවස්ථාවන් පුළුල් කරන ලදි.

පරිපාලනය

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - ලක්සල සමස්ථ මෙහෙයුම් කටයුතු වලට අදාල අණ පනත් , රාජ්‍ය චක්‍රලේඛ හා අනෙකුත් මූල්‍ය හා පරිපාලන උපදෙස් වලට අනුකූලව ක්‍රියාත්මක කරන ලද අතර යහපාලන හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුව කටයුතු කිරීමටද තහවුරු කරන ලදි. සංවිධානයේ ඉලක්ක හා පරමාර්ථ ළඟාකර ගැනීම උදෙසා මෙන්ම අනෙකුත් සහායක සේවාවන් සැපයීම පිණිස පරිපාලන සහ මානව සම්පත් අංශය සැලකිය යුතු කාර්ය භාර්යයක් ඉටුකරන ලදී. අදාළ සමාලෝචිත වර්ෂය තුල කාර්යය මණ්ඩලය **107** කින් සමන්විත වන අතර එහි විස්තර පහත සඳහන් වේ.

2022/12/31 දිනට සමස්ත කාර්ය මණ්ඩලය

ජ්‍යෙෂ්ඨ මට්ටම	**08**	
ද්විතීක මට්ටම	**08**	
තෘතීක මට්ටම	**52**	
ප්‍රාථමික මට්ටම	**09**	**77**
කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය		**30**
මුළු ගණන		**107**

පෙර වසර සමඟ සසඳා බැලීමේදී සමාලෝචිත වර්ෂය තුල කාර්ය මණ්ඩල තත්ත්වය **118** සිට **107** දක්වා අඩු වී ඇත. තරඟකාරී අලෙවි පරිසරය තුළ මනා ලෙස සකසන ලද කොටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ව්‍යාපාර සැලසුම් ක්‍රියාත්මක කිරීම උදෙසා වන ප්‍රයත්නයේදී මනා ලෙස පුහුණුව ලද, කාර්යක්ෂම කාර්ය මණ්ඩලයක් ගොඩනැංවීම යන්න තීරක කාර්යභාරයක් ඉටු කරයි.

අලෙවි කාර්ය මණ්ඩලය මෙන්ම සහාය කාර්ය මණ්ඩලය වෙත පුහුණු සහ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් සේවයේ ගුණාත්මකභාවය සහ ඵලදායීතාවය වර්ධනය කිරීමට පියවර ගනු ලැබිණි.

2023 වසරේදී විදේශීය සංචාරකයින්ගේ පැමිණීම යථාවත් වනු ඇතැයි අපේක්ෂා කරන හෙයින් ස්වයං මූල්‍යය වාණිජ ආයතනයක් ලෙස නව ව්‍යාපාරික සැලැස්මක් යටතේ අලෙවි කටයුතු තවදුරටත් වර්ධනය කිරීමට අවශ්‍ය සියලුම උපාය උපක්‍රම ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - ලක්සල

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්

අංක	අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයන්ගේ නම්	පත්වීම් කාල සීමාව	
		සිට	දක්වා
1.	සජිත් එම්. කොඩිකාර මයා	03.01.2020	02.05.2023
2.	මධුමාලී අල්විස් මිය (නීතීඥ)	03.01.2020	02.05.2023
3.	කේ.එල් මහින්ද සමරතුංග මයා	03.01.2020	09.01.2023
4.	එන්.පී.ඒ.ආර් ජයවර්ධන මිය	24.01.2020	02.03.2022
5.	ඩී. ජීවානාදන් මයා	09.10.2020	වත්මන්
6.	ලක්මල් වික්‍රමආරච්චි මයා * (නීතීඥ)	11.11.2020	23.12.2022
7.	සංජීව ධර්මවර්ධන මයා	08.06.2021	02.05.2023

* අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස මෙන්ම ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - ලක්සල සභාපති ලෙස කටයුතු කර ඇත.

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - ලක්සල

ජ්‍යෂ්ඨ කළමණාකරණ කණ්ඩායම

සී.එන්.දහනායක මහතා	වැ.බ කළමණාකාර අධ්‍යක්ෂ/අධ්‍යක්ෂ (මානව සම්පත් හා පාලන)
කේ.සී.ජයවර්ධන මහතා	අධ්‍යක්ෂ (විකුණුම්)
ඊ.ඇලන් ඩෙලිල්කන් මහතා	වැඩ බලන අධ්‍යක්ෂ (මුදල්)
සම්පත් සෙනෙවිරත්න මහතා	වැ.බ අධ්‍යක්ෂ (සැපයුම් ජාල සංවර්ධන)
වජිරා සමරරත්න මිය	නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන)
දේවිකා කුමාරි අතුකෝරළ මිය	නියෝජ්‍ය අධ්‍යක්ෂ (බෙදාහැරීම්)
ඒ.එල්.එම් රිස්වාන් මහතා	සහකාර අධ්‍යක්ෂ (ආදායම් හා වියදම්)
ගයාන් ලියනගේ මහතා	වැ.බ සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත් හා පාලන)
දිනේෂ් අබේකෝන් මහතා	තොරතුරු තාක්ෂණ ඒකක ප්‍රධානී

අපේ කෘතඥතාව

පළමුව මම ලක්සල වෙනුවෙන් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී, සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු බතික්, අත්‍යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යතුමා හට මහත් කෘතවේදීත්වය පුදදෙනු කැමැත්තෙමි. අප ආයතනය ක්ෂේත්‍රයෙහි ඉහලම ස්ථානයකට නංවාලනු පිණිස නිරතුරු ඇවැසි තීරණ සහ නිගමනයන් ලබාදීම සම්බන්ධයෙන් නිරන්තරයෙන් අවශ්‍ය තීන්දු තීරණ ගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්හටද කෘතවේදීත්වය පුදනු කැමැත්තෙමි.

තවද, අවශ්‍ය සෑම අවස්ථාවකම අප ආයතනයේ ප්‍රගතිය උදෙසා ලබාදුන් සහය වෙනුවෙන් මම අප අමාත්‍යාංශයේ ලේකම්තුමාට කෘතවේදීත්වය පළ කර සිටිමි.

එමෙන්ම ආයතනයේ පරිපාලන, මූල්‍ය සහ අලෙවි කටයුතු සම්බන්ධයෙන් ඵලදායීව තම සේවක මණ්ඩලය මෙහෙයවූ අංශ ප්‍රධානීන්ට මෙන්ම ආයතනයේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව පවත්වාගෙන යාමට දායකත්වය ලබාදෙන ලද අනෙකුත් සමස්ථ කාර්ය මණ්ඩලය වෙතද මාගේ ස්තුතිය පුද කරමි.

අප සමග අත්වැල් බැඳගනිමින් පාරිභෝගික අවශ්‍යතා නිවැරදිව හඳුනාගෙන, නව නිපැයුම් හඳුන්වා දෙමින්, සම්ප්‍රදායික මෙන්ම නව්‍ය වූ නිපැයුම් ඇතුළුව අත්කම් සහ සමරු භාණ්ඩ සපයමින් අප හා එක්වූ නිපැයුම්කරුවන්ට මෙහිදී විශේෂ ස්තුතිය පුද කරනු කැමැත්තෙමි. එසේම සෑම අවස්ථාවකම අප ආයතනය මත විශ්වාසය රැඳවූ දේශීය මෙන්ම විදේශීය ගණුදෙනුකරුවෝද අපේ විශේෂ ස්තුතියට හිමිකම් ලබති.

අනාගතයේදී ශ්‍රී ලාංකික ග්‍රාමීය ආර්ථිකය සවිමත් කිරීමට සහ ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්වයන් නගා සිටුවීමට ඇවැසි සියළු පියවර අප ආයතනය මගින් ගනු ලබන බව ප්‍රකාශ කරන අතරම ඉදිරි වසරවලදී අපගේ අලෙවිය රුපියල් බිලියනයක් දක්වා වර්ධනය කිරීමට අපේක්ෂා කරන බවද අවසන් වශයෙන් පවසමි.

තවද, ආයතනයේ මානව සම්පත මෙන්ම භෞතික සම්පත්ද ක්‍රමිකව කළමණාකරනය කිරීම හරහා සමස්ත කාර්ය මණ්ඩලයෙන්ම කාර්යක්ෂම සහ සඵලදායී දායකත්වය ලබාගනු පිණිස සකසන ලද උපායමාර්ගික සැලසුමකට අනුව ආයතනයේ පොදු කාර්ය පිරිවැය සැලකිය යුතු මට්ටමකින් පහත හෙලමින් 2023 වසර තුළ අපගේ ලාභ ප්‍රතිශතය වර්ධනය වන තත්වයක පවත්වා ගැනීමටද සැලසුම් සකස් කර ඇත.

සභාපති,

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය- ලක්සල

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන

2022 දෙසැම්බර් **31**

2022

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

2022 වර්ෂය සඳහා ආදායම් විශ්ලේෂණය

<u>වර්ෂය පිළිබඳ සංක්ෂිප්තව</u> - ගෝලීය යන්දර්භය සහ ශ්‍රී ලංකා ආර්ථිකය

2022 වසර යනු COVID-19 වසංගත තත්ත්වය පැතිරී යාමෙන් පසු ගෝලීය ආර්ථිකය යථා තත්ත්වයට පත්වෙමින් තිබූ කාල පරිච්ඡේදයක් වන අතර ශ්‍රී ලංකාව ද ක්‍රමක්‍රමයෙන් මන්දගාමී සාමාන්‍ය තත්ත්වයට පත්වෙමින් තිබිණි.

පාස්කු ඉරිදා ප්‍රහාරය සහ 2020/2021 වසංගත තත්ත්වයත් සමඟ 2019 වසරේ සිට සංචාරක කර්මාන්තයට දැඩි බලපෑමක් එල්ල විය. 2022 කාලය තුළ ශ්‍රී ලංකාව දේශපාලන පසුබෑමකට ලක් වූ අතර ඉන්ධන අර්බුදය සමඟ වූ දේශීය නොසන්සුන්තාව නිසා ආර්ථික අර්බුදය වඩාත් අයහපත් තත්ත්වයකට පෙරළිණි. සියලු ආර්ථික සහ දේශපාලන තත්ත්වයන් මධ්‍යයේ සංචාරක පැමිණීම්වලට බාධා කරමින් මාර්ග බාධක ඇති කිරීම සහ දේශපාලන නොසන්සුන්තාව හේතුවෙන් ලක්සල ආදායම කෙරෙහි තවදුරටත් බලපෑම් එල්ල විය. 2022 ගිණුම් වර්ෂයේ දී ලක්සල පළමු කාර්තුවේ දී වූ විකුණුම් රටාව යළි ලබා ගැනීමට පටන් ගත්තේය. එහෙත් වෙළඳ භාණ්ඩ නිෂ්පාදනය කිරීමට සහ ලක්සල වෙත සැපයීමට සැපයුම්කරුවන්ට මූල්‍යමය ස්ථාවරත්වයක් නොමැතිවීම හේතුවෙන් එම වේග පවත්වා ගැනීමට නොහැකි විය. මෙම තත්ත්වය යටතේ බොහෝ සැපයුම්කරුවන්ගේ මිලදී ගැනීම් නොමැතිව වසර පුරා අරගල කිරීමට ලක්සලට සිදු වූ අතර එය ආදායම් පහත වැටීමට තවත් හේතුවක් විය.

<u>ලක්සල කාර්තුමය ආදායම් - 2022</u>


1 වන කාර්තුව - රු.මි.**81**

2 වන කාර්තුව - රු.මි.**58**

3 වන කාර්තුව - රු.මි.**61**

4 වන කාර්තුව - රු.මි.**83**

පහත දක්වා ඇති ප්‍රස්ථාරයෙන් පෙන්නුම් කරන්නේ COVID -19 සහ අනෙකුත් බාහිර සාධකවලින් පසු ක්‍රමානුකූලව සහ මන්දගාමී ලෙස ප්‍රකෘතිමත් වීමයි.



2022 වසරේ රු.මි. **285** ක් වූ ලක්සල විකුණුම් ආදායම **2021** වසරට සාපේක්ෂව **108%** ක සැලකිය යුතු වර්ධනයක් විය. පරිපාලන වියදම් රු.මි. **218** ක් වූ අතර එය රු.මි. **31** ක **(16%)** වැඩිවීමකි. **2021** වසරේ රු.මි. **8.2** ට සාපේක්ෂව **2022** සඳහා විකුණුම් සහ බෙදා හැරීමේ පිරිවැය රු.මි. **16.4** ක් වූ අතර එය ආසන්න වශයෙන් **100%** ක වැඩිවීමකි. **2022** වර්ෂයේ වියදම් වැඩිවීම, **2021** දී ඇණහිට වූ මෙහෙයුම සහ **2022** දී ආදායම් හා වියදම් ක්‍රමයෙන් ඉහළ යාම සාධාරණීකරණය කරයි. ශ්‍රී ලං.හ.ක.මණ්ඩලයේ ලාභ අලාභ ගිණුමට අනුව **2021** දී රු.මි. **58** ක අලාභයේ සිට **2022** දී රු.මි. **99** දක්වා **2022** දී ශුද්ධ අලාභයේ වැඩි වීමක් පෙන්නුම් කළද, එයට **2021** දී සිදු කරන ලද රු.මි. **82** ක භාණ්ඩාගාර ප්‍රදානය හේතු වී ඇත. ප්‍රදාන නොවන්නට සංසන්දනාත්මකව 2021 වසරේ මෙහෙයුම් අලාභය ආසන්න වශයෙන් රු.මි. 141 ක් වනු ඇත.

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
විස්තීරණ ආදායම පිළිබඳ ප්‍රකාශය
2022 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා

		2022	2021
	සටහන්	රු.	රු.
ආදායම	**3**	283,623,048	137,495,835
විකුණුම් මිල		(113,608,044)	(70,979,440)
දළ ලාභය		**170,015,004**	**66,516,395**
ලැබී ඇති ප්‍රදාන		-	82,905,000
ඉතුරුම් ගිණුම් සඳහා පොලී	**4**	68,432	-
වෙනත් ආදායම්	**5**	36,504,933	29,392,750
පරිපාලන වියදම්	**6**	(218,216,410)	(187,070,962)
විකුණුම් සහ බෙදාහැරීම් වියදම්	**7**	(19,533,586)	(8,239,659)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ප්‍රතිඵල		**(31,161,627)**	**(16,496,476)**
මූල්‍ය පිරිවැය	**8**	(67,879,043)	(42,050,371)
බදුවලට පෙර ලාභය		**(99,040,670)**	**(58,546,847)**
වර්ෂය සඳහා ලාභය		**(99,040,670)**	**(58,546,847)**

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
2022 දෙසැම්බර් **31** දිනට

	සටහන්	2022 රු.	2021 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත සහ උපකරණ	**09**	**777,610,291**	829,595,922
මුළු ජංගම නොවන වත්කම්		**777,610,291**	**829,595,922**
ජංගම වත්කම්			
භාණ්ඩ වට්ටෝරු	**10**	**483,901,901**	545,265,950
වෙළඳ සහ අනෙකුත් ලැබීම්	**11**	**89,980,444**	106,938,043
මුදල් සහ මුදලට සමාන දෑ	**12**	**53,477,494**	37,790,147
මුළු ජංගම වත්කම්		**627,359,839**	**689,994,140**
මුළු වත්කම්		**1,404,970,130**	**1,519,590,062**
හිමිකම් සහ බැඳීම්			
හිමිකම්			
ප්‍රකාශිත ප්‍රාග්ධනය		**69,628,878**	69,628,878
ප්‍රාග්ධන සංචිත		**510,806**	510,806
ප්‍රත්‍යාගණන සංචිත		**454,366,157**	454,366,157
ප්‍රාග්ධන දීමනා		**107,951,172**	107,951,172
රඳවාගත් ඉපැයුම්		**(281,916,107)**	(184,017,430)
මුළු හිමිකම්		**350,540,907**	**448,439,584**
ජංගම නොවන බැඳීම්			
විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම්	**13**	**57,679,530**	56,925,460
විලම්බිත ආදායම	**14**	**8,824,711**	24,164,714
දිගු කාලීන ණය ගැනීම්	**15**	**374,306,377**	383,781,882
මුළු ජංගම නොවන බැඳීම්		**440,810,618**	**464,872,056**
ජංගම බැඳීම්			
වෙළඳ සහ අනෙකුත් ගෙවීම්	**16**	**456,650,784**	482,273,952
ගෙවිය යුතු ආදායම් බදු	**8**	**21,798,486**	21,798,486
කෙටි කාලීන ණය ගැනීම්	**17**	**134,183,223**	101,219,872
බැංකු අයිරා	**18**	**986,112**	986,112
මුළු ජංගම බැඳීම්		**613,618,605**	**606,278,422**
මුළු බැඳීම්		**1,054,429,223**	**1,071,150,478**
මුළු හිමිකම් සහ බැඳීම්		**1,404,970,130**	**1,519,590,062**

.....
ඊ. ඒ. ඩෙලිල්කන් මහතා
මූල්‍ය අධ්‍යක්ෂ (වැඩ බලන)

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් 2023.06.23 දින තුම්මුල්ල ලක්සලේ පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අත්සන් කරන ලදී.

.....	.....	.....
ආර්.කේ.එල්. ජාගොඩ මිය	ඩී. ජීවනාදන් මයා	රුෂාන් මාරඹගේ මයා
මණ්ඩල සාමාජික	**මණ්ඩල සාමාජික**	**සභාපති**

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය
2022 දෙසැම්බර් **31** න් අවසන් වසර සඳහා

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	ප්‍රාග්ධන සංචිත	ප්‍රත්‍යාගණන සංචිත	ප්‍රාග්ධන ප්‍රදාන	රඳවා ගත් ඉපැයීම්	මුළු හිමිකම්
	රු.	රු.	රු.	රු.	රු.	රු.
2021 ජනවාරි **1** වන දිනට ශේෂය	69,628,878	510,806	454,366,157	107,951,172	(125,845,784)	**506,611,229**
පෙර වසරේ දෝෂ වලට ගැලපීම්	-	-	-	-	375,201	**375,201**
වර්ෂය සඳහා ලාභය					(58,546,847)	**(58,546,847)**
2021 දෙසැම්බර් **31** දිනට ශේෂය	**69,628,878**	**510,806**	**454,366,157**	**107,951,172**	**(184,017,430)**	**448,439,584**
පෙර වසරේ දෝෂ වලට ගැලපීම්					1,141,993	**1,141,993**
වර්ෂය සඳහා ලාභය	-	-	-		(99,040,670)	**(99,040,670)**
						-
2022 දෙසැම්බර් **31** දිනට ශේෂය	**69,628,878**	**510,806**	**454,366,157**	**107,951,172**	**(281,916,107)**	**350,540,907**

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මුදල් ප්‍රවාහ ප්‍රකාශය
2022 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා

	සටහන්	2022	2021
මෙහෙයුම් වලින් උපයන මුදල්		රු.	රු.
බදු වියදමට පෙර ලාභය		**(99,040,670)**	**(58,546,847)**
ගැලපීම් :			
පාරිතෝෂික ශේෂය ගැලපීම් 2020		-	(1,393,899)
ගොඩනැගිලි සංවර්ධන ගැලපීම් 2020			277,696
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්		2,827,910	3,682,500
පොලී වියදම්		67,703,833	41,938,619
ක්ෂයවීම්		26,475,424	26,440,306
ඉතිරිකිරීමේ ගිණුම් සඳහා පොලී		(68,432)	-
ප්‍රාග්ධන වියදම් ක්‍රමක්ෂය		25,590,180	25,590,164
පෙර වසර ගැලපීම		1,141,993	375,201
ප්‍රදාන ක්‍රමක්ෂය		(15,340,000)	(25,340,004)
		9,290,238	**13,023,737**
කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම්			
භාණ්ඩ වට්ටෝරු		61,364,049	73,943,636
වෙළඳ සහ අනෙකුත් ලැබීම්		16,957,599	(35,853,026)
වෙළඳ සහ අනෙකුත් ගෙවීම් - බදු සමග		(25,623,168)	(39,295,657)
මෙහෙයුම් වලින් ඉපයූ මුදල්		**61,988,718**	**11,818,689**
ගෙවන ලද පාරිතෝෂික		(2,073,840)	(1,567,120)
ගෙවන ලද පොලී		(67,703,833)	(41,938,619)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදනය කරන ලද ශුද්ධ මුදල්		**(7,788,955)**	**(31,687,050)**
ආයෝජන කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ			
ඉතිරිකිරීමේ ගිණුම් සඳහා පොලී		68,432	-
දේපල, පිරියත සහ උපකරණ මිලදී ගැනීම		(79,978)	15,216,310
ආයෝජන කාර්යයන් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල්		**(11,546)**	**15,216,310**
මූල්‍ය කාර්යයන්ගේ මුදල් ප්‍රවාහ			
ලබා ගත් දිගු/කෙටි කාලීන ණය		26,030,434	115,135,218
ණය ආපසු ගෙවීම		(2,542,587)	(84,509,657)
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල්		**23,487,847**	**30,625,561**
මුදල් සහ මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)		**15,687,347**	**14,154,821**
වසර ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන දෑ		36,804,035	22,649,214
වසර අවසානයේ දී මුදල් සහ මුදල් සමාන දෑ		**52,491,382**	**36,804,035**
බැංකු අයිරා	**18**	(986,112)	(986,112)
අනෑනි මුදල් සහ බැංකුවේ ඇති මුදල්	**12**	53,477,494	37,790,147
		52,491,382	**36,804,035**

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1. ආයතනික තොරතුරු

1.0 සමාගම

''ලක්සල'' යන වෙළඳ නාමය යටතේ ජනප්‍රියත්වය ලැබ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (SLHB හෙවත් ''ලක්සල'') ශ්‍රී ලංකාව පුරා නිෂ්පාදනය කරනු ලබ අත්කම් නිර්මාණ අලෙවි කිරීමේ කටයුතුවල යෙදෙන රජය සතු එකම ආයතනය වේ.

1.1 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන් වන්නේ දේශිය සහ විදේශිය වෙළඳපොළට ත්‍යාග සහ සිහිවටන අයිතම අලෙවිකරණය සහ විකිණීමයි.

2. සාමාන්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.0 මිනුම්කරණ පදනම

2022 දෙසැම්බර් **31** දිනට සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, විස්තීරණ ආදායම පිළිබඳ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සමග මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ (මූල්‍ය ප්‍රකාශන) සටහන් ශ්‍රී ලංකා වරළත් ගණකාධිකාරී අයතනය විසින් නිකුත් කළ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතින්වලට (SLFRSs) අනුව සකස් කරන ලදී.

මෙම මූල්‍ය ප්‍රකාශන, සාධාරණ අගය යටතේ මනින ලද මූල්‍ය වත්කම් සහ වගකීම් සඳහා හැරුණු කොට ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ සකස් කර ඇත. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතින්වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා ඇතැම් තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු භාවිත කිරීම අවශ්‍ය වේ. සියළුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇත.

2.1 ගිණුම්කරණ ඇස්තමේන්තු, උපකල්පන සහ තීන්දු භාවිතය

ප්‍රතිපත්ති සහ වාර්තාගත වත්කම් සහ වගකීම්, ආදායම් සහ වියදම් ප්‍රකාශ අදාළ කරගැනීමට බලපාන තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන ගොඩනැගීමට අවශ්‍ය වන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම LKAS (ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත) සහ SLFRS වලට අනුකූලව සිදු කර ඇත. ඇස්තමේන්තු සහ ආශ්‍රිත උපකල්පන ඓතිහාසික පරිචය සහ වෙනත් මූලාශ්‍ර මගින් නොපෙන්වන ඉදිරියට ගෙන ආ වත්කම් සහ වගකීම් වටිනාකම්, තීන්දු ගැනීමේ පදනම සකසන අවස්ථාවල දී ලැබෙන ප්‍රතිඵල යටතේ සාධාරණ යයි විශ්වාස කරන වෙනත් විවිධ සාධක මත පදනම්ව ඇත. සත්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුවලින් වෙනස් විය හැකිය. ඇස්තමේන්තු හා ඉහත කී උපකල්පන ඉදිරියට ගෙනයන පදනම මත සමාලෝචනය කර ඇත. ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා සංශෝධන, ඇස්තමේන්තු සංශෝධනය කරන කාලය තුල දී එකී සංශෝධන එකී කාලය සඳහා පමණක් හෝ සංශෝධනය කරන කාලයේදී සහ අනාගතයේදී බලපාන්නේ නම් හෝ වර්තමාන සහ අනාගත යන කාල දෙකම සඳහා බලපාන්නේ නම් හෝ එකී කාල තුලදී හඳුනාගෙන ඇත.

2.2 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී, අපේක්ෂා කළ හැකි අනාගත කාලයක් අඛණ්ඩව පවත්වාගෙන යාමට සංවිධානය සතු වගකීම පිළිබඳව අපි තක්සේරුවක් කර ඇත්තෙමු. අනාගතය පිළිබඳ පවතින සියලු තොරතුරු සැලකිල්ලට ගනිමින්, ඇවර කිරීමේ හෝ වෙළඳාම නතර කිරීමේ අවශ්‍යතාවයක් අපි අපේක්ෂා නොකරමු.

2.3 සන්සන්දනාත්මක තොරතුරු

සමාගම විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති නිරතුරුව ක්‍රියාවට නංවා ඇති අතර පෙර වසරේ භාවිතා කළ ප්‍රතිපත්තිවලට අනුකූල වන අතර අවශ්‍ය අවස්ථාවන්හි දී සාධාරණ ඉදිරිපත් කිරීම සඳහා නැවත වර්ගීකරණය කර ඇත.

2.4 සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලුම කාල පරිච්ඡේද සඳහා අඛණ්ඩව අදාළ කරගෙන ඇති අතර මණ්ඩලය විසින් ද නිරතුරුව ම ක්‍රියාත්මක කරගෙන ඇත.

2.4.1 ආදායම් හඳුනාගැනීම

සමාගම වෙත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමට හැකි තාක් දුරට ආදායම හඳුනාගෙන ඇති අතර ආදායම විශ්වාසදායක ලෙස මැනිය හැකිය. ආදායම මනිනු ලබන්නේ ලැබුණු හෝ ගිණුම්ගත කළ අගයේ සාධාරණ වටිනාකමට හෝ වෙළඳ වට්ටම් සහ අදාළ බදුවල ශුද්ධ ලැබිය යුතු අගයට වේ.

විදේශ මුදලින් සිදු කෙරෙන ගනුදෙනුවල දී එම ගණුදෙනුව සිදුවන අවස්ථාවේ පවතින විදේශ විනිමය අනුපාතිකය අනුව විනිමය පරිවර්තනය කරනු ලැබේ.

ශේෂ පත්‍ර දිනට විදේශ ව්‍යවහාර මුදලින් පවතින මූල්‍ය වත්කම් සහ වගකීම් එදිනට පවතින විදේශ විනිමය අනුපාතිකය අනුව ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලැබේ.

2.4.2 දේපළ පිරියත සහ උපකරණ

අ) හඳුනා ගැනීම සහ මිනුම්කරණය

වත්කම් හා බැඳි අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒමට හැකියාවක් ඇත්නම් සහ මෙම වත්කම්වල පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි නම් දේපල, පිරියත සහ උපකරණ හඳුනාගැනීමේ පදනම ලෙස පිළිගැනේ.

ඉඩම් හැර දේපල පිරියත සහ උපකරණ, සමුච්චිත ක්ෂයවීම් සහ ඕනෑම සමුච්චිත හායන පාඩුවක් අඩුකර පිරිවැයට දක්වනු ලැබේ. එම පිරිවැයට, වත්කම් අත්කර ගැනීමට සෘජුවම ආරෝපණය කළ හැකි වියදම් ඇතුළත් වේ. ස්වයං-නිර්මිත වත්කම්වල පිරිවැයට ද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රමය, ස්වකීය අපේක්ෂිත පරිහරණය සඳහා ක්‍රියාකාරී තත්ත්වයකට ගෙන ඒම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි වෙනත් පිරිවැය, සහ භාණ්ඩ ගලවා ඉවත් කිරීම සහ ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය ඇතුළත් වේ. දේපල, පිරියත සහ උපකරණ එකිනෙකට වෙනස් ප්‍රයෝජ්‍ය ආයු කාල සහිත ප්‍රධාන උපාංගවලින් සමන්විත වන විට ඒවා දේපල, පිරියත සහ උපකරණවල වෙනම අයිතමයන් වශයෙන් ගිණුම්ගත කරනු ලැබේ.

දේපළ පිරියත සහ උපකරණවල ඉදිරියට ගෙන යන වටිනාකම නැවත ලබාගත නොහැකි බව පෙනී යන අවස්ථාවක ඉදිරියට ගෙන යන වටිනාකම හායනයක් ලෙස හඳුනා ගනී.

දේපල, පිරියත සහ උපකරණවල අයිතමයක් අපහරණය කිරීමේදී ලැබෙ ලාභයක් හෝ අලාභයක් එකී අයිතමයන් විකිණීමෙන් ලැබෙන මුදල් හා වත්කමිහි ඉදිරියට ගෙන යාමේ අගය සසඳා තීරණය කරනු ලබන අතර එය විස්තීරණ ආදායම් ප්‍රකාශය තුල හඳුනාගනු ලැබේ.

කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව සතු ඉඩම් සහ ගොඩනැඟිලි **1993** දී ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයට පවරා දෙන ලදී. මෙයට රු. **112,330,000/=** ක් වටිනා දේපළ **11** (එකොළහක්) ඇතුළත් විය. **2012-2013** වර්ෂයේ දී ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කරන විට රුපියල් **20,700,000/=** ක වටිනාකමකින් යුත් දේපළ තුනක් **(3)** අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් ජාතික ශිල්ප සභාවට පවරා දී ඇති අතර ඉතිරිය ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ ශේෂ පත්‍රයේ පවතී.

ආ) ක්ෂය වීම

ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලයට එරෙහිව ලියා හැරීම සඳහා වන ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ සින්නක්කර ඉඩම් හැර සියලු දේපල, පිරියත සහ උපකරණ පිරිවැය මත සරල රේඛා ක්‍රමයක් භාවිතා කරමිනි.

භාවිතා කරනු ලබන ප්‍රධාන අනුපාත පහත පරිදි වේ.

1. ගොඩනැගිලි	2.5%
2. යන්ත්‍රෝපකරණ	10%
3. ඉන්වෙන්ට්‍රි ද්‍රව්‍ය	10%
4. ගෘහ භාණ්ඩ	10%
6. පරිගණක දෘඪාංග සහ මෘදුකාංග	20%

*2018 වසර දක්වා පරිගණක අයිතමවල ක්ෂයවීම් සිදු කරනු ලැබුවේ සරල රේඛා ක්‍රමයක් භාවිතා කරමිනි. නමුත් මෙම අයිතම වර්ෂ 8කට ඉහතදී මිලදී ගෙන ඇති බැවින් සරළ රේඛා ක්‍රමයට ගණනය කිරීමේදී ක්ෂය කළ අගය, එකතුකළ මුළු අගය ඉක්මවා යන බැවින් 2019 වර්ෂයේදී හීනවන ශේෂ ක්‍රමය භාවිත කිරීමට ලක්ෂලට සිදු විය. එමගින් 2019 වසරේ සිට හීනවන ශේෂ ක්‍රමය ක්‍රියාත්මක කර ඇත.

ඇ) දේපල, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද ලාභය / අලාභය.

දේපල, පිරියත සහ උපකරණ කාර්යයෙන් බැහැර කිරීමෙන් හෝ අපහරණය කිරීමෙන් වන යම් ලාභයක් හෝ පාඩුවක් විකිණීම සිදුවන කාලසීමාව තුල හඳුනාගන්නා අතර එය වෙනත් මෙහෙයුම් ආදායම් ලෙස වර්ගීකරණය කරයි.

(ඈ) ප්‍රදාන ක්‍රමක්ෂය අනුපාතිකය සහ ගොඩනැගිලි සංවර්ධන වියදම් ක්ෂයවීම හරහා ලාභයට හා අලාභයට අනවශ්‍ය ආදායමක් හෝ වියදම් පැමිණීම වැළැක්වන අයුරින් ප්‍රදාන ක්‍රමක්ෂ අනුපාතිකය සහ ගොඩනැගිලි සංවර්ධන වියදම් ක්ෂයවීම් ඒ අනුව සකස් කර ඇත.

2.4.3 නොනිමි ප්‍රාග්ධනය

වර්ෂය තුළ දරන ලද, මූල්‍ය ප්‍රකාශ දිනට සම්පූර්ණ කර නොමැති ප්‍රාග්ධන වියදම්, අත්තිකාරම් ගෙවීම් ලෙස පෙන්වනු ලබන අතර, වර්ෂ අවසානයේදි සම්පූර්ණ කර ඇති ප්‍රාග්ධන වත්කම් භාවිතයට ගත් වර්ෂය අවසානයේ දේපල, පිරියත සහ උපකරණ වෙත මාරු කර ඇත.

2.4.4 අස්පෘශ්‍ය වත්කම්

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය විසින් අත්පත් කර ගන්නා ලද නිශ්චිත ප්‍රයෝජ්‍ය ආයු කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කම්, පිරිවැය අඩු කළ සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානි පාඩු මත මනිනු ලැබේ.

අ) හඳුනාගැනීමේ පදනම

වත්කම්වලට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමට සම්භාවිතාවක් ඇත්නම් සහ පිරිවැය අඩු සමුච්චිත ක්‍රමක්ෂ සහ සමුච්චිත හායන පාඩු යටතේ පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම් අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනා ගැනේ.

ආ) පසු කාලීන වියදම්

පසු කාලීන වියදම් ප්‍රාග්ධනීකරණය වන්නේ එය අදාළ වන නිශ්චිත වත්කම්වල අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩි කරන විට පමණි. අභ්‍යන්තරව ජනනය කරන ලද වියදම් කීර්ති නාමය සහ සන්නාම ඇතුළු අනෙකුත් සියලුම වියදම්, ආදායම් ප්‍රකාශනයේ දරන ලද ලෙස පිළිගැනේ.

ඇ) කාර්යයෙන් බැහැර කිරීම සහ අපහරණය

අපහරණය කිරීමේදී හෝ අපහරණයෙන් පසුව භාවිතයෙන් අපේක්ෂා කරන අනාගත ආර්ථික ප්‍රතිලාභ නොමැති විට අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා නොගනී.

ඇ) ක්‍රමක්ෂය කිරීම

අස්පෘෂ්‍ය වත්කම් භාවිතය සඳහා පවතින දින සිට ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය මත සරළ රේඛීය ක්‍රමයට ආදායම් ප්‍රකාශය තුළ ක්‍රමක්ෂය කිරීම හඳුනා ගැනේ.

2.4.5 හායනය

වත්කම් හායනය පිළිබඳ කිසියම් ඇඟවීමක් තිබේ ද යන්න තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයෙහි වත්කම් ප්‍රමාණය එක් එක් මූල්‍ය ප්‍රකාශන ශේෂ පත්‍ර දිනයන්හි දී සමාලෝචනය කෙරේ. එවැනි කිසියම් ඇඟවීමක් තිබේ නම්, වත්කමේ ප්‍රතිස්ථාපන වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක ඉදිරියට ගෙන යන වටිනාකම හෝ එයින් උත්පාදන කළ හැකි මුදල, එහි ප්‍රතිස්ථාපන වටිනාකම ඉක්මවන විටක හායන අලාභයක් හඳුනාගනු ලැබේ. ආදායම් ප්‍රකාශය තුළින් හායන පාඩු හඳුනා ගනු ලැබේ.

2.4.6 වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ

වෙළඳ ලැබීම් යනු සාමාන්‍ය ව්‍යාපාරයේ දී විකුණන ලද භාණ්ඩ හෝ සේවා සඳහා ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු මුදල්ය. වසරක් හෝ ඊට අඩු කාලයකින් එකතු කිරීම අපේක්ෂා කරන්නේ නම් (හෝ ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ ඊටත් වඩා දීර්ඝ වන්නේ නම්), ඒවා ජංගම වත්කම් ලෙස වර්ග කෙරේ. එසේ නොමැති නම්, ඒවා ජංගම නොවන වත්කම් ලෙස ඉදිරිපත් කෙරේ.

2.4.7 භාණ්ඩ තොග

භාණ්ඩ තොග, නියත සහ අළුත්වැඩියා කළ හැකි අයිතම සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමෙන් අනතුරුව පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු වටිනාකමට අගය කරනු ලැබේ. පිරිවැය, බරතැබූ සාමාන්‍ය පිරිවැය ක්‍රමය භාවිතයෙන් තීරණය කරනු ලැබේ. ශුද්ධ උපලබ්ධි අගය යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතු අතරතුරදී තොගය විකිණිය හැකි මිල වේ.

2.4.8 මුදල් සහ මුදලට සමාන දෑ

අතැති මුදල් සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණු සඳහා මුදල් බවට පහසුවෙන් පරිවර්තනය කළ හැකි කෙටි කාලීන ඉහළ ද්‍රවශීලී ආයෝජන, මුදල් හා මුදලට සමාන දෑ ලෙස අර්ථකථනය කරන අතර අතැති මුදල් හා ඉතිරි ශුද්ධ බැංකු අයිරා, කෙටි කාලීන ණය සහ කෙටි කාලීන ආයෝජන මුදල් සහ මුදලට සමාන දෑ ලෙස සැළකේ.

2.4.9 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) අංක 07- මුදල් ප්‍රවාහ ප්‍රකාශ අනුව වක්‍ර ක්‍රමය භාවිත කරමින් සකස් කර ඇත.

2.4.10 සේවක ප්‍රතිලාභ

අ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාම පාරිතෝෂිකය

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ වන විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම සඳහා වන වගකීම, **2022** කාලපරිච්ඡේදය තුල ආයතනයේ සේවකයන් **108** දෙනෙකු ආවරණය කරනු ලබන නිශ්චිත වූ ප්‍රතිලාභ සැලැස්මකි. මෙම වගකීම සම්පූර්ණ කිරීම සඳහා සෑම සේවකයකුගේ ම සේවය ආරම්භ කළ පළමු වර්ෂයේ සිට සම්පූර්ණ කරන සෑම වර්ෂයක් සඳහා ම අදාළ මුල්‍ය වර්ෂයේ අවසාන මාසයේ වැටුපෙන් අඩක් මත පදනම් ව ගණනය කළ මුදලට සමාන වෙන් කිරීමක් මූල්‍ය ප්‍රකාශයේ දිනට ඉදිරියට ගෙන යනු ලැබේ. වර්ෂය ආරම්භයේ ඉදිරියට ගෙන ආ වෙන් කිරීම් සහ වර්ෂය අවසානයේ ඉදිරියට ගෙන ගිය වෙන් කිරීම් අතර වෙනස විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ සළකා බලනු ලැබේ.

ආ) නිශ්චිත දායකත්ව සැලැස්ම - සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදල

අදාළ ව්‍යවස්ථා සහ නියෝග අනුව සේවක අර්ථසාධක අරමුදලට දායකත්වය සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට දායකත්වය සඳහා සේවකයන් සුදුසුකම් ලබයි. ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය සේවකයන්ගේ පූර්ණ සේවා නියුක්තිය මත සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාර අරමුදලට පිළිවෙලින් 12% සහ 3%ක දායකත්වයක් දක්වයි.

2.4.11 ණය ගැනීම්

ණය ගැනීම් මූලිකව, සාධාරණ අගය, ගණුදෙනුවල පිරිවැයේ ශුද්ධ අගයට හඳුනාගනු ලැබේ. පසුගිය කාලවලදී ණය ගැනීම් මිල සඳහන් කරනු ලැබුවේ සඵල පොලී ක්‍රමය භාවිත කරමින් හිලව් කළ පිරිවැයටය. එම කටයුත්තේ යම් වෙනසක් (ශුද්ධ ගණුදෙනු පිරිවැය) සහ ණය නිදහස් කිරීමේ වටිනාකම ණය ගැනීම් කළ කාලය තුල ආදායම් ප්‍රකාශය තුල හඳුනාගනියි.

2.4.12 බැරකම් සහ ප්‍රතිපාදන

අතීත සිද්ධින්වල ප්‍රතිඵලයක් වශයෙන් වර්තමාන නෛතික/සාධනීය බැඳීමක් පවතින විට බැරකම් සහ ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශනවල පිළිගනු ලබන අතර, ඒවා පියවීම තුලින් ආර්ථික ප්‍රතිලාභ සහිත සම්පත් පිටතට ගලා යාම අපේක්ෂා කෙරේ. මූල්‍ය ප්‍රකාශන දින සිට වර්ෂයක් ඇතුළත ණය හිමියන්ගේ ඉල්ලීම පිට ගෙවිය යුතු බැඳීම් මූල්‍ය ප්‍රකාශනවල ජංගම බැරකම් ලෙස සැළකේ. මූල්‍ය ප්‍රකාශන දින සිට වර්ෂයක් ඇතුළත ගෙවිය යුතු බැරකම් මූල්‍ය තත්ත්ව පිළිබඳ විස්තීරණ ප්‍රකාශනයේ ජංගම නොවන බැරකම් ලෙස සැළකේ.

අ) වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු තුල සැපයුම්කරුවන් වෙතින් ලබා ගත් භාණ්ඩ හා සේවා සඳහා ගෙවීමට බැඳී සිටින මුදල් ගෙවිය යුතු වෙළඳ ගෙවිය යුතු දෑ වේ. ගෙවීම වර්ෂයක් හෝ ඊට අඩු කාලයක් තුලදී (දීර්ඝ ව්‍යාපාර කටයුත්තකදී නම් සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුල) ගෙවිය යුතු වේ නම් එම ගෙවිය යුතු ගිණුම් ජංගම බැරකම් ලෙස වර්ග කෙරේ. එසේ නොවේ නම් ඒවා ජංගම නොවන බැරකම් ලෙස ඉදිරිපත් කෙරේ.

නියෝජන තොග ඇතුළුව සියළු මිලදී ගැනීම් සඳහා භාණ්ඩ ලැබීමේ පත්‍ර රැස් කිරීමේ අවස්ථාවේ ගිණුම් පොත්වල වගකීම් වාර්තා කිරීමේ ප්‍රතිපත්තිය ලක්සල අනුගමනය කර තිබුණි. කෙසේ වෙතත්, තොග ණය හිමියන්ට ගෙවීම් කරනු ලබන්නේ අදාළ තොග අලෙවි කරන විට පමණි.

2.4.13 ආදායම් බදු

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය මෙහෙයුම් කටයුතු සහ උපයනු ලබන බදු අය කළ හැකි ආදායම් සම්බන්ධයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශන ඉදිරිපත් කරන දිනට මෙරට පනවා ඇති හෝ හරයාත්මකව පනවා ඇති බදු නීතිය මත පදනම්ව වර්තමාන ආදායම් බදු ගාස්තු ගණනය කරයි. අදාළ බදු නියාමනය අර්ථ නිරූපණයට යටත් වන අවස්ථා සම්බන්ධයෙන් බදු වාර්තාවල තත්ත්වයන් කළමනාකරණය වරින් වර ඇගයීමට ලක් කරයි. බදු අධිකාරිය වෙත ගෙවීමට අපේක්ෂිත මුදල මත පදනම්ව අවශ්‍ය අවස්ථාවලදී ප්‍රතිපාදන සළසයි.

භාණ්ඩ විකිණීම

භාණ්ඩ විකුණුම් ආදායම, ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිලාභ, වෙළඳ වට්ටම් සහ ප්‍රමාණ වට්ටම් පිළිබඳ ප්‍රතිඵලයේ සාධාරණ අගයට මනිනු ලැබේ. හිමිකාරිත්වයේ සුවිශේෂී අවදානම් සහ ප්‍රතිලාභ ගැනුම්කරුට මාරු වී ඇති, ප්‍රතිඵලය අයකර ගැනීමට හැකි, ආශ්‍රිත පිරිවැය සහ භාණ්ඩවල විභව්‍ය ප්‍රතිලාභ විශ්වාසනීයව ඇස්තමේන්තු කළ හැකි සහ භාණ්ඩ පිළිබඳ කළමනාකරණයේ සම්බන්ධයක් නොමැති අවස්ථාවක ආදායම හඳුනාගනු ලැබේ. අවදානම සහ ප්‍රතිලාභ මාරු වීම භාණ්ඩ විකිණීමේ ගිවිසුමේ පුද්ගලික නියමයන් අනුව වෙනස් වේ.

වෙනත් මෙහෙයුම් ආදායම්

අ) දේපල පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද ලාභය සහ පාඩුව

ආ) දේපළ , පිරියත සහ උපකරණ කාර්යයෙන් බැහැර කිරීම හෝ අපහරණය කිරීම මත ලාභ හෝ පාඩු විකිණීම සිදු කළ කාල පරිච්ඡේදය තුල හඳුනාගන්නා අතර වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ වර්ගීකරණය කරනු ලැබේ.

ලැබුණු ප්‍රදාන

වියදම් සම්බන්ධයෙන් රජය ප්‍රදාන ලබා දෙන්නේ නම්, එය හිලව් කිරීමට අදහස් කරන පිරිවැයට ගැලපීම සඳහා අවශ්‍ය කාල පරිච්ඡේදය තුල ආදායමක් ලෙස හඳුනා ගනියි. ප්‍රදානය වත්කමක් සම්බන්ධයෙන් වන අවස්ථාවක, සාධාරණ අගය විලම්භිත ආදායම් ගිණුමකට බැර කර අදාළ වත්කමේ අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ආයු කාලය පුරා සමාන වාර්ෂික වාරික මගින් ආදායම් ප්‍රකාශයට නිදහස් කරනු ලැබේ.

ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන

ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන විලම්භිත ආදායමක් වශයෙන් හඳුනාගෙන වසර **10** ක කාලසීමාවක් තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ.

ලැබුණු පුනරාවර්තන ප්‍රදාන

ආදායම් සම්බන්ධ ප්‍රදාන 'වෙනත් ආදායම්' වශයෙන් වෙනමම වාර්තා කිරීම හෝ අදාළ වියදම්න් අඩු කිරීම කරනු ලැබේ.

2.4.14 වියදම් හඳුනාගැනීම

දරන ලද පිරිවැය සහ විශේෂිත ආදායම් අයිතමයන්ගේ ඉපයීම් අතර සෘජු සම්බන්ධය පදනම් කරගනිමින් ආදායම් ප්‍රකාශයේ වියදම හඳුනාගනු ලැබේ. ව්‍යාපාර කටයුතු තුළදී සහ දේපළ, පිරියත සහ උපකරණ කාර්යක්ෂමව නඩත්තු කිරීමේදී උද්ගත වන සියළු වියදම් ආදායම් ප්‍රකාශයට ආරෝපණය කර ඇත.

ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා සමාගමේ සහ සමූහයේ කාර්ය සාධනයේ අංග සාධාරණ ලෙස ඉදිරිපත් කරන පදනම මත, "වියදම් ශ්‍රීත" ක්‍රමය අනුගමනය කර ඇත.

අ) පුනරාවර්තන වියදම්

ආදායම් ප්‍රකාශයේ දක්වා ඇති පරිදි මණ්ඩලය විසින් උපයා ඇති ලාභය සියළුම ප්‍රකාශිත වගකීම් සඳහා සහ දේපළ පිරියත සහ උපකරණ ක්ෂය සඳහා වෙන් කිරීම් කළ පසුව ඉපයූ ලාභ වේ.

ආ) ප්‍රාග්ධන වියදම්

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා හෝ ව්‍යාපාරයේ ඉපැයීම් ධාරිතාව වැඩි කිරීමේ අරමුණින් ස්ථීර ස්වභාවයේ වත්කම් පුළුල් කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා දරන ලද වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සැළකේ.

දේපළ, පිරියත සහ උපකරණ අපහරණය කිරීම මත ආදායම් ස්වභාවයේ ලාභ හෝ පාඩු ආදායම් ප්‍රකාශයේ ගිණුම්ගත කර ඇත.

2.4.15 ණය ගැනුම් පිරිවැය

ණය ගැනුම් පිරිවැය ඒවා දරණ ලද වර්ෂය තුලදී වියදමක් වශයෙන් හඳුනාගනු ලැබේ.

2.4.16 බැඳීම් සහ අවිනිශ්චිතතා

අවිනිශ්චිතතා යනු අතීත සිද්ධින් මගින් පැන නගින ලද සහ මණ්ඩලයේ පාලනයෙන් බැහැර අනාගත අවිනිශ්චිත සිද්ධියක් ඇති වීම හෝ ඇති නොවීම මත පමණක් නිශ්චය කර ගනු ලබන විභව්‍ය වත්කම් හෝ බැඳීම් වේ.

2.4.17 ශේෂ පත්‍ර දිනට පසුව පැන නගින සිද්ධින්

සියළුම වැදගත් පශ්චාත් ශේෂ පත්‍ර සිද්ධින් අදාළ අවස්ථාවන්හි දී අනාවරණය කර ගළපා ඇතැයි යනුවෙන් සළකා ඇත.

3. ආදායම	**2022**	**2021**
	රු.	රු.
ප්‍රදර්ශනාගාරවල අලෙවිය		
තුම්මුල්ල	123,515,057	53,131,642
කෞතුකාගාරය	18,066,992	6,117,605
ගාල්ල	22,808,891	9,350,552
පේරාදෙණිය	17,655,278	6,432,911
කටුනායක	32,888,767	6,742,306
කොටුව	10,614,864	9,736,767
වැලිපැන්න 1	7,922,129	4,465,532
බත්තරමුල්ල	9,514,277	3,719,753
මහනුවර	10,732,566	3,320,564
කටුබැද්ද	7,929,004	4,318,325
පින්නවල	5,873,549	2,067,206
නුවරඑළිය	1,530,948	1,343,977
මුළු ප්‍රදර්ශනාගාර විකුණුම්	269,052,322	110,747,140
සෘජු/පාරිභෝගික රුචිය අනුව කළ ඇණවුම්	14,570,726	26,748,695
	283,623,048	**137,495,835**
ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT)	-	-
	283,623,048	**137,495,835**

4. ආයෝජන		
ඉතිරිකිරීමේ ගිණුමේ පොලී	68,432	66,412

5. වෙනත් ආදායම්	**2022**	**2021**
	රු.	රු.
කුලී ආදායම	20,174,168	3,910,627
ප්‍රදාන ක්‍රමක්ෂය ආදායම	15,340,003	25,340,004
විදේශ විනිමය ලාභය	990,762	75,707
	36,504,933	**29,392,750**

6. පරිපාලන වියදම්	සටහන්	**2022**		**2021**	
		රු.		රු.	
වැටුප් සහ දීමනා *		71,541,865		66,552,828	
දිරි දීමනාව		-		96,000	
ඊ.පී.එෆ්. සහ ඊ.ටී.එෆ්. (E.P.F. & E.T.F.)		9,199,595		9,593,951	
පාරිතෝෂිකය		2,827,910		3,682,500	
ප්‍රවාහන දීමනාව		9,524,741		5,276,175	
අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු සහ මණ්ඩල රැස්වීම් වියදම්		454,625		467,482	
විගණන ගාස්තු/බෘත්තීය ගාස්තු		900,000		1,219,200	
නීති ගාස්තු		264,500		155,000	
ආරක්ෂක ගාස්තු		9,157,393		5,399,593	
කුලී සහ වරිපණම් *		19,679,069		12,056,104	
විදුලිය		7,624,906		7,741,522	
ක්ෂය වීම		26,475,424		26,440,306	
ගොඩනැගිලි සංවර්ධන ක්‍රමක්ෂ කිරීම-Exp		25,590,180		25,590,164	
පිරිසිදු කිරීමේ සේවා		6,039,163		4,911,651	
අනෙකුත් කාර්ය මණ්ඩල පිරිවැය *	**6.1**	7,210,644		3,946,858	
වෙනත් මෙහෙයුම් පිරිවැය *	**6.2**	21,726,395		13,941,628	
			218,216,410		**187,070,962**

උප සටහන 6.1

අනෙකුත් කාර්ය මණ්ඩල පිරිවැය යටතේ ඇතුළත් වේ *	**2022**		**2021**	
	රු.		රු.	
අතිකාල	1,879,207		283,127	
සේවක සුබසාධක	3,000,638		1,743,422	
මුදල් ආරක්ෂණ පොලී	206,347		214,999	
කාර්යමණ්ඩල පුහුණුව	53,200		-	
වෛද්‍ය වියදම්	2,071,252		1,705,310	
VRS	-		-	
		7,210,644		**3,946,858**

* 2021 වසර හා සසඳන විට රුපියල් මිලියන 5ක වැටුප් සහ දීමනා වියදම් වැඩිවීමට හේතු වී ඇත්තේ අංක EST/5/4/24(XL) හා 2022-01-13 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව සිදු කරන ලද රුපියල් 5000 වැටුප් වර්ධකයයි.

* 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේදී කුලී සහ වරිපණම් වියදම්වල වැඩිවීම දළ වශයෙන් රු. මිලියන 7කින් නිරූපණය කෙරේ. මෙයට හේතු වී ඇත්තේ 2021 වර්ෂයේදී ගුවන්තොටුපල ගුවන් සේවා සහ කැනොවින් ප්‍රදර්ශනාගාර කුලී මගින් ලබා දුන් සහන ය. 2022 දී ඩොලරයේ මිල වැඩිවීම නිසා කටුනායක ගුවන්තොටුපල ගුවන් සේවා කුලී වියදම් වැඩි විය.

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

උප සටහන 6.2 **වෙනත් මෙහෙයුම් පිරිවැය යටතේ ඇතුළත් වේ ***	**2022** **රු.**		**2021** **රු.**	
SSCL බදු වියදම්	989,444			
වෙළඳ දැන්වීම්	445,973		564,365	
මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය	2,083,958		1,032,132	
තැපැල් ගාස්තු/දුර/ටෙලෙක්ස්	9,012,214		9,070,246	
ඉන්ධන සහ ලිහිසි තෙල්	1,936,575		704,042	
තොග සත්‍යාපනය	20,460		175,374	
වෙළඳ බලපත්‍ර ගාස්තු	479,620		-	
පරිගණක වියදම්	138,057		260,890	
රක්ෂණය	138,980		55,764	
ජල බිල්පත	413,000		337,721	
අලුත්වැඩියාව සහ නඩත්තුව - ගොඩනැගිලි	990,980		1,246,317	
අලුත්වැඩියාව සහ නඩත්තුව - යන්ත්‍රෝපකරණ	1,617,899		223,081	
වාහන කුලියට දීමේ ගාස්තු	768,392		-	
පරිවර්තන ගාස්තු	49,150			
සහන ගාස්තු	2,641,668		266,571	
මුද්දර ගාස්තු	25		5,125	
		21,726,395		**13,941,628**

7. විකුණුම් සහ බෙදාහැරීමේ වියදම්	සටහන්	2022	2021
		රු.	රු.
මාර්ගෝපදේශ කොමිස්		8,708,059	2,146,897
ක්‍රෙඩිට් කාඩ් කොමිස්		3,332,395	1,386,182
ඇසුරුම් ද්‍රව්‍ය දේශීය		1,929,021	749,333
ව්‍යාපාර ප්‍රවර්ධනය		1,279,581	557,062
අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම භාණ්ඩ මිලදී ගැනීම		143,763	114,993
ප්‍රදර්ශනය සහ වෙළඳ ප්‍රදර්ශනය		2,156,125	868,000
ගමන් වියදම්		1,897,211	1,144,457
ලියාපදිංචි ගාස්තු		3,000	-
තක්සේරු වියදම්		10,000	1,010,149
රක්ෂණ සහ භාණ්ඩ ප්‍රවාහන ගාස්තු		74,431	171,103
විශේෂ ඇණවුම් වියදම්		-	91,483
		19,533,586	**8,239,659**

	2022	2021
	රු.	රු.
7. මූල්‍ය පිරිවැය		
බැංකු ගාස්තු	175,210	111,752
ණය පොලී - ලංකා බැංකුව	48,800,009	26,703,053
- ප්‍රා.ස.බැ.	18,903,824	15,235,566
	67,879,043	**42,050,371**

* වසංගත කාලසීමාව තුළ සහන කාල ලබා දීම හේතුවෙන් 2021 වර්ෂය ආරම්භයේදී ලබා ගත හැකි ප්‍රධාන ණය 3ක් සඳහා පමණක් ණය පොලී අය කරන ලදී. 2022 වසරේ සහන ණය පොලී සමඟ ණය පොලිය ක්‍රියාත්මක විය. එහි ප්‍රතිඵලයක් ලෙස 2021 වසරට සාපේක්ෂව 2022 දී පොලී වියදම් ඉහළ ගියේය.

09. දේපල, පිරියත සහ උපකරණ

		2022	2021
	සටහන්	රු.	රු.
සින්නක්කර වත්කම්	**9.1**	630,170,527	656,565,973
ගොඩනැගිලි සංවර්ධන පිරිවැය	**9.2**	147,439,764	173,029,950
		777,610,291	**829,595,923**

9.1 සින්නක්කර වත්කම්

	ඉඩම්	ගොඩනැගිලි	පිරියත සහ යන්ත්‍රෝපකරණ	ගෘහභාණ්ඩ උපාංග සහ කාර්යාල උපකරණ	පරිගණක උපකරණ	ලිපි	මෘදුකාංග	සිදු වෙමින් පවතින ප්‍රාග්ධන කටයුතු	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
පිරිවැය හෝ තක්සේරුව									
2021 ජනවාරි **1** දිනට ශේෂය	396,037,214	248,797,761	100,907,491	60,179,729	33,412,316	33,399,357	-	45,451,390	**918,185,258**
එකතු කිරීම්		-	-	-	-	32,266	-	-	**32,266**
ගැලපීම්	(15,248,575)				(10,193,250)		10,193,250		**(15,248,575)**
2021 දෙසැම්බර් **31** දිනට ශේෂය	**380,788,639**	**248,797,761**	**100,907,491**	**60,179,729**	**23,219,066**	**33,431,623**	**10,193,250**	**45,451,390**	**902,968,949**
ගැලපීම්		(666,662)							**(666,662)**
එකතු කිරීම්	-	-	122,500	-	560,990	63,150	-	-	**746,640**
2022 දෙසැම්බර් **31** දිනට ශේෂය	**380,788,639**	**248,131,099**	**101,029,991**	**60,179,729**	**23,780,056**	**33,494,773**	**10,193,250**	**45,451,390**	**903,048,927**
ක්ෂය වීම්									
2021 ජනවාරි **1** දිනට ශේෂය	-	46,254,906	73,215,652	46,487,825	30,755,509	23,248,778	-	-	**219,962,670**
ගැලපීම්					(10,193,250)		10,193,250		**-**
වසර සඳහා අය කිරීම	-	6,203,277	10,090,749	6,017,973	787,923	3,340,384	-		**26,440,306**
2021 දෙසැම්බර් **31** දිනට ශේෂය		**52,458,183**	83,306,401	**52,505,798**	**21,350,182**	**26,589,162**	**10,193,250**		**246,402,976**
වසර සඳහා අය කිරීම	-	6,203,277	10,098,370	6,017,973	809,319	3,346,485	-		**26,475,424**
2022 දෙසැම්බර් **31** දිනට ශේෂය	**-**	**58,661,460**	**93,404,771**	**58,523,771**	**22,159,501**	**29,935,647**	**10,193,250**	**-**	**272,878,400**
ඉදිරියටගෙන ආ ප්‍රමාණයන්									
2021 දෙසැම්බර් 31 දිනට	380,788,639	196,339,578	17,601,090	7,673,931	1,868,884	6,842,461	-	45,451,390	656,565,973
2022 දෙසැම්බර් **31** දිනට	**380,788,639**	**189,469,639**	**7,625,220**	**1,655,958**	**1,620,555**	**3,559,126**	**-**	**45,451,390**	**630,170,527**

9.2 ගොඩනැගිලි සංවර්ධන වියදම්

	2022	2021
පිරිවැය හෝ සලකන ලද පිරිවැය	රු.	රු.
ජනවාරි 1 දිනට ශේෂය	386,954,261	387,252,013
අතිරේක		
* ගලපන ලද		(297,752)
දෙසැම්බර් **31** දිනට ශේෂය	**386,954,261**	**386,954,261**
ක්‍රමක්ෂය		
ජනවාරි 1 දිනට ශේෂය	213,924,317	188,354,210
වසර සඳහා අය කිරීම	25,590,185	25,590,164
* ගලපන ලද		(20,056)
දෙසැම්බර් **31** දිනට ශේෂය	**239,514,502**	**213,924,317**
දෙසැම්බර් **31** දිනට ඉදිරියට ගෙන ආ ප්‍රමාණයන්	**147,439,764**	**173,029,950**

9.2 ගොඩනැගිලි සංවර්ධන වියදම් **(සම්බන්ධිතයි)**

ක්‍රමක්ෂය ස්ථානය	වසර	දරන ලද පිරිවැය	අනුපාතය % දශමස්ථාන දෙකකට	2022 ජනවාරි 01 දිනට සමුච්චිත ක්‍රමක්ෂ ශේෂය	2022 තුළ ක්‍රමක්ෂය	2022 දෙසැම්බර් 31 ට සමුච්චිත ක්‍රමක්ෂ ශේෂය	2022 දෙසැම්බර් 31 දිනට රැගෙන ආ ගොඩනැගිලි සංවර්ධන වියදම් ප්‍රමාණය
කෞතුකාගාරය	2013	172,847,765					
කෞතුකාගාරය	2014	1,881,295					
කෞතුකාගාරය	2015	389,177					
එකතුව		**175,118,237**	5.77%	84,051,411	10,101,215	94,152,627	80,965,610
බත්තරමුල්ල	2013	117,704,905					
බත්තරමුල්ල	2014	7,119,772					
බත්තරමුල්ල	2015	9,744,208					
එකතුව		**134,568,885**	5.77%	63,360,759	7,762,237	71,122,995	63,445,891
පින්නවල	2013	**10,086,000**	10.00%	9,077,400	1,008,600	10,086,000	-
වාගොල්ල	2014	**810,487**	10.00%	648,389	81,050	729,438	81,049
පේරාදෙණිය	2013	31,657,965					
පේරාදෙණිය	2014	8,968,352					
පේරාදෙණිය	2015	677,222					
එකතුව		**41,303,539**	10.00%	36,140,906	4,130,355	40,271,260	1,032,279
වැලිපැන්න	2013	**10,269,019**	10.00%	9,242,119	1,026,900	10,269,019	-
තුරහ තරහ පිටිය	2013	**1,113,613**	10.00%	1,002,248	111,365	1,113,613	-
කටුනායක	2013	**1,060,004**	10.00%	954,000	106,004	1,060,004	-
උණවටුන	2013	**1,000,004**	10.00%	900,000	100,004	1,000,004	-
K-Zone	2013	**8,353,071**	10.00%	7,517,759	835,312	8,353,071	-
තුන්මුල්ල		**769,766**	10.00%	538,852	76,978	615,829	153,937
මහනුවර	2019	1,993,423					
ගලපන ලද	2020	508,213					
		2,501,636	10.00%	490,474	250,165	740,639	1,760,997
මුලු එකතුව		**386,954,261**		**213,924,317**	**25,590,185**	**239,514,498**	**147,439,762**

10. භාණ්ඩ වට්ටෝරු	**සටහන්**	**2022** **රු.**	**2021** **රු.**
ප්‍රදර්ශනාගාර වෙළඳාම ගුණාත්මයෙන් ඉහළම නිමි භාණ්ඩ		328,862,842	394,180,031
ගුණාත්මයෙන් දෙවන නිමි භාණ්ඩ		154,646,764	150,731,992
අමුද්‍රව්‍ය සහ කෙරෙමින් පවතින කාර්යයන්	**10.1**	392,295	353,927
		483,901,901	**545,265,950**

10.1 අමුද්‍රව්‍ය සහ කෙරෙමින් පවතින කාර්යයන්

අමුද්‍රව්‍ය සහ ක්‍රියාත්මක වෙමින් පවතින කාර්යයන් පාරිභෝගික රුචිය අනුව සාදන ලද සෘජු ඇණවුම් සඳහා නිෂ්පාදනය කරන ලද අයිතම වලින් සමන්විත වේ..

11. වෙළඳ සහ අනෙකුත් ලැබීම්	**සටහන්**	**2022** **රු.**	**2021** **රු.**
වෙළඳ ලැබීම්	**11.1**	14,930,358	27,661,720
අනෙකුත් ලැබීම්	**11.2**	12,069,562	16,000,356
තැන්පතු සහ පෙරගෙවුම්	**11.3**	62,980,524	63,275,967
		89,980,444	**106,938,043**
11.1 වෙළඳ ලැබිය යුතු			
වෙළඳ ණය ගැතියන්		23,562,897	36,827,011
අඩමාණ ණය ගැතියන්	**11.4**	(9,578,372)	(9,578,372)
ලැබිය යුතු ක්‍රෙඩිට් කාඩ්		945,833	413,081
		14,930,358	**27,661,720**
11.2 වෙනත් ලැබිය යුතු දේ			
කාර්ය මණ්ඩල ණය		265,000	332,500
ලැබිය යුතු කුලිය		11,804,919	12,562,954
ලැබිය යුතු ESC		-	3,110,010
ලැබිය යුතු විවිධ		(357)	(5,108)
		12,069,562	**16,000,356**
11.3 තැන්පතු සහ පෙරගෙවුම්			
ආරක්ෂක තැන්පතු		126,022	126,022
පෙරගෙවුම්		4,229,119	4,859,893
අත්තිකාරම් ගෙවීම්		35,181,010	35,131,399
රඳවා තබා ගැනීමේ මුදල්		12,502,564	12,502,564
ආපසු ගෙවිය හැකි තැන්පතු		10,828,714	10,836,768
ලැබිය යුතු ඇපකර		113,095	(180,679)
		62,980,524	**63,275,967**

11.4 අඩමාණ ණය ගැතියන්

2018 වර්ෂයේදී පැරණි ශේෂයන් සම්බන්ධයෙන් රු.9,578,372/=ක් සඳහා ප්‍රතිපාදන සම්මත කර තිබුණි.

	2022	2021
	රු.	රු.
12. මුදල් සහ මුදල්වලට සමාන දෑ		
බැංකුවේ ඇති මුදල්	52,051,111	37,016,937
අතැති මුදල්	1,426,383	773,210
	53,477,494	**37,790,147**
ආදායම් සංචිතයේ අනෙකුත් සංරචක		
ආරම්භක ශේෂය	(124,540,999)	(124,916,200)
පෙර වසරේ සංශෝධනය	1,141,993	375,201
	(123,399,006)	**(124,540,999)**

ආදායම් සංචිතයේ ඇති අනෙකුත් සංරචක අතරට සමුච්චිත ආදායම් සංචිත හරහා ප්‍රත්‍යවෙක්ෂණ කර සම්මත කරන ලද පූර්ව කාල පරිච්ඡේදවලට අදාළ සංශෝධන ඇතුළත් වේ.

	2022	2021
	රු.	රු.
13. විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්		
ආරම්භක ශේෂය	56,925,460	56,203,979
වසර සඳහා පාරිතෝෂික ප්‍රතිපාදන	2,827,910	3,682,500
වසර තුළ ගෙවන ලද පාරිතෝෂිකය	(2,073,840)	(1,567,120)
ගලපන ලද පාරිතෝෂිත ශේෂය		(1,393,899)
අවසන් ශේෂය	**57,679,530**	**56,925,460**

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් සඳහා බැඳීම සංවිධානයේ සේවකයින් 108ක් ආවරණය වන පරිදි නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මකි.

14. විලම්බිත ආදායම

දීමනාව පිළිබඳ විස්තරය	වසර	ක්‍රමක්ෂය වීමේ අනුපාතය	ලැබී ඇති මුල් දීමනාව	**2021** දෙසැම්බර් **31** දිනට ක්‍රමක්ෂය නොකළ ශේෂය	**2022** තුළ ක්‍රමක්ෂ කළ මුදල	**2022** දෙසැම්බර් **31** දිනට ක්‍රමක්ෂය නොකළ ශේෂය
ආර්ථික සංවර්ධන	**2012**	10%	100,000,000			
වෙළඳ හා වාණිජ අමාත්‍යාංශය	**2013**	10%	36,000,000	3,600,000	3,600,000	-
අයවැය ප්‍රතිපාදන	**2013**	10%	10,224,643	1,022,464	1,022,464	-
අයවැය ප්‍රතිපාදන	**2013**	10%	42,109,637	8,421,926	4,210,964	**4,210,962**
අයවැය ප්‍රතිපාදන	**2013**	10%	11,099,920	1,109,992	1,109,992	-
අයවැය ප්‍රතිපාදන	**2013**	10%	7,828,426	782,845	782,845	-
ආර්ථික සංවර්ධන	**2014**	10%	35,000,000	7,000,000	3,500,000	**3,500,000**
අයවැය ප්‍රතිපාදන	**2014**	10%	11,137,374	2,227,486	1,113,737	**1,113,749**
එකතුව			**253,400,000**	**24,164,713**	**15,340,002**	**8,824,711**

	2022	2021
	රු.	රු.
15. දිගුකාලීන ණය ගැනීම්		
ආරම්භක ශේෂය	477,586,230	439,723,409
වර්ෂය තුළ ලබාගත් ණය	177,076,555	78,964,206
වසර තුළ ගෙවූ ණය	(151,046,121)	(41,101,385)
අවසන් ශේෂය	503,616,664	477,586,230
(අඩු කළා) වසරක් ඇතුළත ගෙවිය යුතු	(129,310,287)	(93,804,348)
දිගුකාලීන ණය බැඳීම්	**374,306,377**	**383,781,882**

15.1 ලංකා බැංකුව - 2020 අවසන් වන විට ණය ශේෂය රුපියල් මිලියන 273

ආරම්භයේ දී කොටුව ගොඩනැගිල්ල උකස් කර කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා රුපියල් මිලියන 950 කට 2012 සිට 2018 දක්වා කාලය තුළ ණය ලබා ගන්නා ලදී. ලබාගත් ණය මුදලින් ප්‍රදර්ශනාගාර වැඩි දියුණු කරන අතරම, ලක්සල ණය ගෙවීම සඳහා ආදායමේ සැලකිය යුතු වර්ධනයක් ලබා ගත්තේය. අවසානයේ ප්‍රාග්ධන ණය ප්‍රමාණය පියවූ අතර 2013 වසරේ සිට 2019 දක්වා ලංකා බැංකු ණය රුපියල් මිලියන 273 දක්වා අඩු කෙරිණි. නමුත් රටේ පවතින ආර්ථික තත්ත්වය හේතුවෙන් 2020 වසරේ සිට 2022 වසර දක්වා ප්‍රාග්ධනය සහ පොලී පියවීමට ලක්සලට නොහැකි විය. ඒ නිසා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබාදුන් පරිදි 2020 සහ 2022 වසර වලදී පමා සහන රැසක් ලබා දී ලංකා බැංකුවේ නොගෙවූ මුළු ණය ප්‍රමාණය රුපියල් මිලියන 332.6ක් බවට පත් කෙරිණි.

15.2 2022 මුදල් වර්ෂය තුළ දැනට පවතින ණය 3 සඳහා අමතර පමා සහන හයක් ලබා දෙන ලදී.

ලංකා බැංකුවේ ණය ශේෂය 2021	රු.මි. 306
ලංකා බැංකුවේ පොලී සහ ප්‍රාග්ධනය 2022	රු.මි. 26.6
ලංකා බැංකුවේ මුළු ණය ශේෂය	**ර .මි. 332.6**

15.3 ප්‍රාදේශීය සංවර්ධන බැංකුව - රු.මි.200

හදිසි කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා 2013 වර්ෂයේ දී ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ කැලණිය ශාඛාවෙන් රුපියල් මිලියන 200ක පහසුකමක් ලබා ගන්නා ලදී. මහා භාණ්ඩාගාරය බැංකුව හරහා ණය පහසුකම් සලසා දී ඇති බැවින් ලක්සල ආයතනයෙන් කිසිදු ඇපයක් ලබා දී නොමැත. 2021 වර්ෂයේදී COVID-19 නිසා ඇති වූ මූල්‍ය තත්ත්වය හේතුවෙන් ලක්සලට ගෙවීමට නොහැකි වූ රුපියල් මිලියන 12.9 ක පොලිය ප්‍රාග්ධනීකරණය කරන ලදී.

	2022	2021
	රු.	රු.
16. වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දේ		
වෙළඳ ගෙවිය යුතු	255,675,927	290,919,988
වෙනත් ගෙවිය යුතු	112,832,631	119,436,360
උපචිත වියදම්	88,142,226	71,917,604
	456,650,784	**482,273,952**
17. කෙටි කාලීන ණය ගැනීම්		
දිගුකාලීන ණය බැඳීම්වල වත්මන් කොටස	129,310,287	93,804,348
කෙටි කාලීන ණය	4,872,936	7,415,524
	134,183,223	**101,219,872**

	2022	2021
	LKR	LKR
18. බැංකු අයිරා		
බැංකු අයිරා	**986,112**	**986,112**

රුපියල් 986,112.00 (2021: රුපියල් 986,112.00) බැංකු අයිරාව වසර අවසාන වන විට මුදල් පොතේ දිස්වන ශේෂයයි. මූල්‍ය වර්ෂයේ ලංකා බැංකුවේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමත් සමඟ රුපියල් මිලියන 15ක අයිරා පහසුකම සඳහා බැංකුව විසින් අනුමැතිය ලබා දෙන ලදී..

19. අවිනිශ්චිත වගකීම් සහ බැඳීම්

මණ්ඩලයට එරෙහිව විභාග වෙමින් පවතින නඩු:

උසාවි අංක	නඩුව ගොනු කළේ:	නඩුව ගොනු කරනු ලැබුවේ	නඩුවේ ස්වභාවය	වත්මන් තත්ත්වය
DMR/0280/13	2015 ජූලි 13	කෝට්ටේ මහ නගර සභාව	සූර්ය පැනල සවිකිරීමේ කොන්ත්‍රාත්තුව උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් ලක්සලට එරෙහිව කෝට්ටේ මහ නගර සභාව විසින් දිසා අධිකරණයේ ගොනුකළ නඩු	රු. 4,020,000ක් පොලිය සමඟ කෝට්ටේ මහ නගර සභාවට ගෙවීමට තීරණය විය. කෙසේ වෙතත් මෙම නඩුවට අදාළව ලක්සල ආයතනය විසින් අභියාචනයක් ඉදිරිපත් කර ඇත. අධිකරණ නීත්‍යුව ලබා දුන් බැවින්, 2022 දෙසැම්බර් 31 වන විට ගෙවිය යුතු මුදලට සමාන මුදලක් ලබා දෙන ලදී.
DMR/2255/16	2016 මැයි 9	ඩිමෝ පුද්. සමාගම	ඉතිරි මුදල් නොගෙවා කොන්ත්‍රාත්තුව උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් ලක්සලට එරෙහිව ඩිමෝ විසින් දිසා අධිකරණයේ ගොනු කරන ලද නඩු.	තීරණය තවමත් ලබා දී නොමැති අතර 2022 දෙසැම්බර් 31 වන දිනට කිසිදු සසම්භාව් බැඳීමක් නොපවතී.
138/2018/MR	2018 මාර්තු 8	JAT හෝල්ඩිංග්ස් පුද්. සමාගම	ලක්සල විසින් සංචාරක මණ්ඩලයෙන් ලබාගෙන JAT හෝල්ඩිංග්ස් වෙත උප කොන්ත්‍රාත්තුවක් ලබා දී ගෙවීමට ඇති රු. 8,184,683.49 ක ගෙවීමක් සම්බන්ධයෙන් කොළඹ වාණිජ මහාධිකරණයේ ගොනු කරන ලද නඩු.	ලක්සල (SLHB) වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුව විරෝධතා ඉදිරිපත් කර ඇත.
139/2018/MR	2018 අප්‍රේල් 10	JAT හෝල්ඩිංග්ස් පුද්. සමාගම	ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ 22 වැනි මහලේ පිහිටි බේරුම්කරණ මධ්‍යස්ථානය (Arbitration centre) ප්‍රතිසංස්කරණය කිරීමට ලක්සල අධිකරණ අමාත්‍යාංශය සමඟ ගිවිසුමක් අත්සන් කර ඇත. ලක්සල මෙය JAT හෝල්ඩිංග්ස් සමාගමට උප කොන්ත්‍රාත්තුවක් මගින් ලබා දී තිබූ අතර වැඩ අවසන් කර ඇත. නමුත් අධිකරණ අමාත්‍යාංශය JATහෝල්ඩිංග්ස් වෙත ගෙවිය යුතු ඉතිරි මුදල් පියවා තිබුණේ නැත. එබැවින් රුපියල් 32,256,980 ක මුදලක් නොගෙවීම සම්බන්ධයෙන් ලක්සලට එරෙහිව JAT හෝල්ඩිංග්ස් විසින් කොළඹ මහාධිකරණයේ නඩුවක් පවරා ඇත.	ලක්සල (SLHB) වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුව විරෝධතා ඉදිරිපත් කර ඇත.

අභ්‍යන්තර විමර්ශන
2015 වසරේ වැඩ තහනම් කර ඇති ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනෙකුට එරෙහිව අභ්‍යන්තර විමර්ශන පැවැත්විණි. අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය තවම ලබා දී නොමැත

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. IMT/B/SLHB/219/FA/2022 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2023 නොවැම්බර් 16 දින

Sri Lanka Handicrafts Board
LAKSALA
2 2 NOV 2023
Chairman Office

සභාපති

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් :- 1. ලේකම් - කර්මාන්ත අමාත්‍යාංශය

2. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

මගේ අංකය எனது இல. My No. } IMT/B/SLHB/219/FA/2022 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2023 නොවැම්බර් 16 දින

සභාපති

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 1 හි 69 වගන්තිය ප්‍රකාරව ජංගම වගකීම් ලෙස හඳුනා ගත යුත්තේ වගකීම් වාර්තා කරන කාලපරිච්ඡේදයෙන් පසු මාස 12 ක් ඇතුලත නිරවුල් කිරීමට නියමිත සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුලදී නිරවුල් කිරීමට අපේක්ෂා කරන වගකීම් සඳහා පමණි. එසේ වුවද, රු.255,675,927 ක මුළු වෙළඳ ණයහිමි ශේෂයෙන් රු.150,440,727 ක් ක්‍රියාකාරී නොවන වර්ෂ 5 ට වැඩි නිරවුල් නොකළ ණයහිමි ශේෂ වේ. එමෙන්ම ණයහිමි ශේෂය තුළ ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය නමින් රු.3,821,690 ක හර ශේෂයක් ඇතුළත් කර තිබූ බැවින් එම වටිනාකමින් ණයහිමි ශේෂය අඩුවෙන් පෙන්නුම් කෙරුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි 28 වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ තොග ශේෂය තුල පවතින දෙවන ගුණත්වයේ රු. 154,646,764 ක තොගයෙහි ඇතුළත් තොග ඌනතා , අළුත්වැඩියා කලයුතු තොග සහ ක්‍රියාකාරී නොවන තොගයන්හි සත්‍ය වටිනාකම් නිරූපණය නොවන බැවින් ඒවා ශුද්ධ උපලබ්ධි අගයට පෙන්නුම් කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි 34 වගන්තිය ප්‍රකාරව තොග සම්බන්ධ සියළු අලාභයන් , අලාභය සිදුවූ කාලපරිච්ඡේදයේ වියදම් සේ හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවත්, 2022 දෙසැම්බර් 31 දිනට පළමු ගුණත්වයේ තොගය තුල ඇතුළත් එකතු වටිනාකම රු.3,425,875 ක් වූ ඌණ තොග සම්බන්ධයෙන් එලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ප්‍රකාරව එකතු වටිනාකම රු.380,788,639 ක් වූ මණ්ඩලය සතු ඉඩම්, රු.19,279,453 ක් වටිනා පරිගණක උපාංග සහ රු.10,193,250 ක් වටිනා මෘදුකාංග ප්‍රත්‍යාගණනය කර වර්තමාන වෙළඳපොල වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) කොටුව ලක්සල ගොඩනැගිල්ලෙහි නවීකරණ කටයුතු අත්හිටවා ඇති බැවින් ඒ වෙනුවෙන් දරන ලද රු.45,451,390 ක් 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කෙරී ගෙන යන වැඩ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) 1993 වර්ෂයේ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් පවරා දෙන ලද මණ්ඩලය විසින් ව්‍යාපාර කටයුතු සිදු කරන නුවරඑළිය සහ තුම්මුල්ල පිහිටි දේපළ වල නීත්‍යානුකූල හිමිකාරිත්වය ලබා ගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) 2022 දෙසැම්බර් 31 දිනට දේපළ පිරියත හා උපකරණ වර්ග 04 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු.228,677,799 ක් වුවද, සමීක්ෂණ වාර්තා අනුව ශේෂය රු.80,955,189 ක් වූයෙන් රු.147,722,610 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඌ) 2015 වර්ෂයේ සිට පැවත එන සත්‍ය වශයෙන් නොපවතින රු.986,112 ක බැංකු අයිරාවක් මූල්‍ය ප්‍රකාශන වල ජංගම වගකීම් යටතේ ඇතුළත් කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේ ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) 2022 වර්ෂයේදී විදේශීය විකුණුම් සඳහා ගිවිසුම්ගත වීමේදී එකඟ වූ පුරස්කාර ගාස්තු රු.9,090,000 ක් වෙනත් ආදායම් වශයෙන් ගිණුම්ගත කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී කිසිදු විදේශීය විකුණුම් සිදුවී නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මණ්ඩලයේ මාර්ගස්ථ තොග ගිණුමේ රු.11,014,318 ක ශේෂයක් පැවතියද මේ පිළිබඳ සැසඳීමට ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඔ) භෞතික තොග සමීක්ෂණ වාර්තා අනුව අනාවරණය වූ තුම්මුල්ල ප්‍රදර්ශනාගාරයට අයත් විකුණුම් වටිනාකම රු.2,915,960 ක් වූ තොග ඌනතාවයක් හා බත්තරමුල්ල ප්‍රදර්ශනාගාරයට අයත් බර තැබූ සාමාන්‍ය පිරිවැයට රු.876,452 ක් වටිනා තොග ඌනතාවයක් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර හෝ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඕ) තුම්මුල්ල ප්‍රදර්ශනාගාරයේ භෞතික තොග සත්‍යාපන වාර්තා අනුව දී සමාලෝචිත වර්ෂයට අදාලව කිසිදු හානියක් වාර්තා නොවුණ ද, මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනට රු.1,712,412 ක තොග හානියක් ගිණුම්ගත කර තිබුණි.

(ක) වෙනත් ගෙවිය යුතු දෑ තුළ අන්තර්ගත රු.37,952,164 ක වටිනාකමැති ණයහිමි ශේෂ සඳහා උපලේඛණ හෝ ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ග) වෙළඳ ණයගැති ශේෂය වන රු. 23,562,897 ක් තහවුරු කර ගැනීම් සඳහා ණයගැතියන්ගෙන් ශේෂ සනාථ ලිපි ලබා ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

(ඡ) උපචිත වියදම් තුල ඇතුළත් එකතුව රු.6,546,541 ක් උපචිත වියදම් ලෙස දක්වා තිබුණද ගෙවිය යුතු පාර්ශවයන් නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි

1.3 මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ

නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා වෙත ලැබී නොමැති අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් නිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ දක්වා ඇති (අ), (ආ),

(ඇ), (ඉ),(උ),(ඒ), (ග),(ඡ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණු වලට සීමාකිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව		**නිරීක්ෂණය**
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i)	මුදල් රෙගුලාසි 371(5)	අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අග්‍රිමය නැවත පියවිය යුතු වුවද ආයතනය විසින් 2022 වර්ෂය තුළ අවස්ථා 58 ක දී ලබාදුන් රු.2,274,351 ක අත්තිකාරම් මුදල් දින 20 ක සිට දින 285 ක් අතර කාල පරාසයක ප්‍රමාදයක් සහිතව පියවා තිබුණි.
(ii)	මුදල් රෙගුලාසි 371 (2) (ආ)	කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා තත්කාර්යය අතුරු අග්‍රිමයක් ලබා දීමට හැකි වුවත් ඊට පටහැනිව රු.100,000 ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම රු.2,360,379 ක් අවස්ථා 10 කදී නිකුත් කර තිබුණි.

(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 21 හා 23 වගන්ති	2015 නොවැම්බර් 19 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ගත් තීරණය පරිදි නිලධාරිනියන් දෙදෙනෙකු වැඩ නහනමකට ලක් කර තිබුණද 2023 මැයි 20 විගණන දින වන විටත් මණ්ඩලයේ විනය බලධරයා විසින් විනය නියෝග ලබා දී නොතිබුණි.
(ඇ)	2021.11.16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වා දී ඇති රාජ්‍ය ව්‍යවසායන් සඳහා මෙහෙයුම් අත්පොතෙහි 6.6 ඡේදය	(i) කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 05 ක් ප්‍රමාද වී 2023 ජූලි 18 දින ඉදිරිපත් කර තිබුණි. (ii) විගණන වාර්තාව සමඟ වාර්ෂික වාර්තාව මූල්‍ය වර්ෂය අවසන් වී මාස 05 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් 2020 හා 2021 වර්ෂවල වාර්ෂික වාර්තා 2023 අගෝස්තු 20 වන විටත් සභාගත කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3. වෙනත් කරුණු

(අ) 2018 වර්ෂයේ මණ්ඩලය විසින් වසා දමා ඇති කටුබැද්ද ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද ණයට විකුණුම් සඳහා ගැණුම්කරුවන් 8 දෙනෙකු වෙනුවෙන් ලැබිය යුතු රු.1,182,386 ක මුදල අයකර ගැනීමට කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) 2022 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැති ශේෂය රු.23,562,897 ක් වුවද මෙම ශේෂය තුළ විවිධ රාජ්‍ය ආයතනවලින් අයවිය යුතු රු.50,000 ට වැඩි ණයගැති ශේෂයන්ගේ එකතුව රු.10,560,711 ක් වුයෙන් එම ශේෂ අයකර ගැනීමට විධිමත් ක්‍රමවේදයක් අනුගමනය නොකර එම ණයගැතියන් සඳහාම නැවැත භාණ්ඩ අලෙවි කර තිබුණි.

(ඇ) නිලධාරීන්ගෙන් අයකරගෙන තිබූ ඇප මුදල් අදාළ නිලධාරීන් නමින් ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් නොකොට එකතුව රු.2,010,000 ක මුදලක් ජංගම ගිණුමේ තැන්පත් කර තිබූ අතර එම මුදලට වාර්ෂිකව සියයට 6 බැගින් රු.1,261,533 ක පොළියක් එකී නිලධාරීන් වෙත ගෙවිය යුතු ලෙස දක්වා තිබුණි.

(ඈ) ගාල්ල උණවටුන සළුසල ආයතනයට අයත්ව තිබූ අක්කර 01 පර්චස් 30.6 ක භූමිය හා ගොඩනැගිලි 2012 ඔක්තෝබර් 11 දිනැති හා අංක 12/1523/553/020 දරණ කැබිනට් තීරණය මඟින් මණ්ඩලය වෙත පවරා දී ඇත. ඒ අනුව ගැනුම් ප්‍රතිඥාව ලෙස සලකා මණ්ඩලය විසින් 2012 දෙසැම්බර් 12 දිනැතිව රු15,248,575 ක් ගෙවා තිබුණ ද සමාලෝචිත වර්ෂයේ ද දේපලෙහි නීත්‍යානුකූල හිමිකාරත්වය හා පරිහරණයකිරීමේ අයිතිය ලබාගැනීමට අපොහොසත් වී තිබුණි. තවද, නුවරඑළිය, තුම්මුල්ල හා කටුබැද්ද පිහිටි දේපලවලද නීත්‍යානුකූල හිමිකාරත්වය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) කැබිනට් අනුමැතිය මත 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා රු.175,118,237 ක් වැයකර නවීකරණය කරන ලද කෞතුකාගාර ගොඩනැගිල්ලට අදාළ ගිවිසුම් කොන්දේසි වලට දෙපාර්ශවය එකඟතාවය පල නොකිරීම නිසා 2023 ජනවාරි 01 වන දින අලෙවි ප්‍රදර්ශනාගාරය ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් මුද්‍රා තබා තිබුණි. එහෙත් 2023 ජුනි 10 විගණිත දින වන විට මුද්‍රා තබා මාස 06 ක් ගත වී තිබුණද ප්‍රදර්ශනාගාරය නැවත ලබා ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබූ අතර, එකතුව රු.99,777,436 ක් වටිනා තොග ප්‍රදර්ශනාගාරය තුළ නිෂ්ක්‍රියව තිබුණි.

(ඊ) 2012 නොවැම්බර් 30 දින තුරහ තරහ පිටියේ ප්‍රදර්ශනාගාරය වෙනුවෙන් පිටියේ වසර 10 ක කාලයකට ගිවිසුම්ගත වීමේදී රු.5,888,000 ක ආපසු අයකර ගත නොහැකි තැන්පත් මුදලක්

නාගරික සංවර්ධන අධිකාරියට ගෙවා තිබුණද, 2018 දෙසැම්බර් 26 දින මෙම අලෙවි ප්‍රදර්ශනාගාරය වසා දමා තිබුණි. එබැවින් මෙය අනාර්ථික ගනුදෙනුවක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

(උ) කොටුව අලෙවි ප්‍රදර්ශනාගාර ගොඩනැගිල්ලෙහි වර්ග අඩි 1200 ක් වැනි ඉතා කුඩා ඉඩ ප්‍රමාණයක් පමණක් භාවිතා කරන බැවින් වර්ග අඩි 40830 ක් පමණ වූ ගොඩනැගිලි පරිශ්‍රය දීර්ඝ කාලයක සිට නිෂ්ක්‍රියව පවතින බවත් නිරීක්ෂණය විය.

(ඌ) 1991 ජූලි 05 දිනැති හා අංක 670 දරණ ගැසට් පත්‍රය මඟින් ගාල්ල අලෙවි ප්‍රදර්ශනාගාරය ඇති ඉඩම සහ දෙමහල් ගොඩනැගිල්ල මණ්ඩලය වෙත පවරා දී තිබුණද නීත්‍යානුකූලව හිමිකම ලබා ගැනීමට විගණිත දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(එ) 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාල පරාසය තුල අයවිය යුතු තුම්මුල්ලේ බැරිස්ටා ආපනශාලාවෙන් රු.456,770 ක්, බැරිස්ටා කෝපි ලංකා ආයතනයෙන් රු.4,243,949 ක්, තරුමිලා මල් සමාජයෙන් රු.20,000 ක් හා සුපර් බැන්ඩ් ව්‍යාපාරික ස්ථාන 8 කින් රු.4,869,200 ක් වශයෙන් රු. 9,589,919 ක් 2022 දෙසැම්බර් 31 වන විටත් හිඟව පැවති අතර එම හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) වසර ගණනාවක සිට පැවත එන රු.12,502,564 ක ව්‍යාපෘති රැඳවුම් මුදල් හා ආපසු ගෙවිය යුතු තැන්පත් ශේෂයේ ඇතුළත් රු.3,838,357 ක ශේෂ හා වෙළඳ භාණ්ඩ හා වෙළඳ නොවන භාණ්ඩ මිලදී ගැනීමට හා පරිපාලන කටයුතු වලට ලබා දී ඇති රු.16,026,936 ක අත්තිකාරම් ශේෂය නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

(ඔ) මණ්ඩලය විසින් 2011 – 2017 දක්වා කාලපරිච්ඡේදය තුළදී කොටුව ලක්සල ගොඩනැගිල්ල උකසට තබා ලංකා බැංකුවෙන් අවස්ථා 12 ක දී රු.849,481,500 ක ණය මුදලක් ලබාගෙන තිබුණි. ණය වාරික හා පොළී මුදල් නිසි පරිදි නොගෙවීම හේතුවෙන් වරින් වර උපචිත පොළී මුදල් ද ප්‍රාග්ධනිත කර බැංකුව විසින් නව ණය මුදල් 14 ක් ලෙස ප්‍රතිලේඛණගත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එවැනි ණය මුදල් 8 ක එකතු වටිනාකම රු.332,607,065 ක් තවදුරටත් ගෙවිය යුතුව පැවතුණි.

(ඕ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත සපයන ලද ප්‍රතිමූල්‍ය ණය පහසුකම හරහා 2013 වර්ෂයේ දී මණ්ඩලය වෙත රු.මිලියන 200 ක ණය මුදලක් ලබාදී තිබුණි. නියමිත පරිදි ණය පොළී නිරවුල් නොකිරීම හේතුවෙන් සමුච්චිත වූ රු.12,909,761 ක ශේෂය ද නව ණය මුදලක් ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි. ඒ අනුව 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව පැවති ණය ශේෂය රු.171,009,585

ක් ද 2021 හා 2022 වර්ෂ සඳහා උපචිත වූ පොළිය රු.33,721,736 ක් ද විය. දිගින් දිගටම ණය සහ පොළී මුදල් නොගෙවීම මත 2022 ඔක්තෝබර් 14 දිනැති හා අංක RDB/HO/RE/122/4 දරන ලිපිය මඟින් නව ණය ගෙවීමේ සැලැස්මක් බැංකුව විසින් යෝජනා කර තිබුණ ද මණ්ඩලය ඊට එකඟතාවය පළකර නොතිබුණි.

(ක) තොග සත්‍යාපන වාර්තා අනුව තොගයෙහි ඇතුලත් විකුණුම් වටිනාකම රු.340,069,730 ක මැණික් හා ස්වර්ණාභරණ දීර්ඝ කාලයක් තිස්සේ දූර්වර්ණ වෙමින් පවතින බැවින් ඒවා විශේෂ වට්ටම් ලබාදෙමින් හෝ යෝග්‍ය අලෙවි උපායමාර්ග මඟින් විකිණීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති